# සිංහල
# භාෂාව හා සාහිත්‍යය

පළමු වාරය

# මොඩියුල අංක 1, 2, 3

# 6 ශ්‍රේණිය

**සිංහල භාෂා දෙපාර්තමේන්තුව**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව**
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදාහැරීම :- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සිංහල භාෂාව හා සාහිත්‍යය - 6 ශ්‍රේණිය
පළමු වාරය

මොඩියුල අංක 01
සුබස් මිහිර

මොඩියුල අංක 02
සුබස් හුරුව - 01

මොඩියුල අංක 03
සාහිත මිහිර - 01

ප්‍රථම මුද්‍රණය 2025

ප්‍රකාශය :- © ජාතික අධ්‍යාපන ආයතනය
සියලු ම හිමිකම් ඇවිරිණි

ISBN

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
දෙල්ගොඩ, කඳුබොඩ, කැරගල පාර, අංක 35/3 දරන ස්ථානයෙහි පිහිටි
සැන්වින් පුද්ගලික සමාගමෙහි
මුද්‍රණය කරවා බෙදා හරින ලදි.

Printed by : Sanvin (Pvt) Ltd.
No. 35/3, Keragala Road, Kanduboda, Delgoda.

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සෑම ඉගෙනුම් ලාභියකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.

නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, 21 වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසිභාවය වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂයමාලාව, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගී සංවාදයක් හරහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2026 වර්ෂයේ සිට 1 හා 6 ශ්‍රේණිවල ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මකබව සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන් ම, මෙම කාර්යයේ දී සුවිශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි.

මෙම කාර්ය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරවදන

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනා ගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර, නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක, තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන් ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනා ගෙන ඇත. එසේ ම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයන් නවීකරණය වන අතර ම නව විෂයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කෙරෙයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය විය යුතු ය. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සැම විෂයක් සඳහා ම ඉගෙනුම පාදක ව මොඩියුල හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේ දී 1 සහ 6 ශ්‍රේණි සඳහාත්, 2027 වර්ෂයේ දී 2 සහ 7 ශ්‍රේණි සඳහාත්, 2028 වර්ෂයේ දී 3 සහ 8 ශ්‍රේණි සඳහාත්, 2029 වර්ෂයේ දී 4 සහ 9 ශ්‍රේණි සඳහාත්, 2030 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සහ කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අවධියේ සිට නව ඉගෙනුම් ක්‍රමවේද ඇතුළත් මොඩියුල සකස් කර ඇති අතර ඉගෙනුම්ලාභියාට අවශ්‍ය මග පෙන්වීම ගුරුවරයාගෙන් බලාපොරොත්තු වේ. එමෙන් ම ස්වයං ඉගෙනුම සඳහා අවශ්‍ය පරිසරය මෙම මොඩියුලවලින් සලසා ඇත. ශිෂ්‍යයන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවන්ට යොමු කර ශිෂ්‍ය හැකියා සංවර්ධනයට මෙම මොඩියුල බෙහෙවින් උපකාරී වන බව අපගේ විශ්වාසය යි. 21 වන සියවසේ කුසලතා වන සාක්ෂරතා, අන්තර් පුද්ගල හැකියා සහ අගයන් ආදිය මනා ලෙස ශක්තිමත් කිරීමට මෙම මොඩියුලවලින් ලැබෙන ඉගෙනුම ඉවහල් වනු ඇත.

නව තාක්ෂණය භාවිතයට අවශ්‍ය මග පෙන්වීම සැම මොඩියුලයක ම දක්වා ඇත. තව ද ශිෂ්‍යයන්ට තමා ළඟා කර ගත් කාර්ය සාධන සහ අධ්‍යාපන අරමුණු පිළිබඳ ව විනිවිදභාවයෙන් ඇගයීමට අවශ්‍ය තක්සේරු උපකරණ ලබා දෙනු ඇත. සැම විට ම නව හැකියා, දැනුම භාවිත අවස්ථාවන් සඳහා යොදවමින් යථාර්ථවාදී ඉගෙනුමකට අවශ්‍ය මග පෙන්වීම ලැබෙන ආකාරයෙන් මොඩියුල නිර්මාණය කර ඇත. විශේෂයෙන් ම මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේද සකස් කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ හිටපු ලේකම් ආචාර්ය උපාලි සේදර, ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න හා මහාචාර්ය ප්‍රසාද් සේතුංග යන මහත්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම මොඩියුල සකස් කිරීමේ දී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මොඩියුල ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි. මෙම මොඩියුල පරිහරණය කිරීමේ දී ඔබ ලබන අද්දැකීම් සහ යෝජනා අපහට ඉතාමත් වැදගත් වන බැවින් ඉදිරි මොඩියුල සංවර්ධනය කිරීමට ඔබගේ අදහස් හා යෝජනා අප වෙත ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

**ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## උපදේශනය, රචනය හා සංස්කරණය

**උපදේශකත්වය** :-

මහාචාර්ය මංජුලා විතානපතිරණ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා
සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය** :-

ආචාර්ය පූජ්‍ය කුකුරම්පොල
ඤාණවිමල හිමි
අධ්‍යක්ෂ
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය** :-

මදාරා ජයරත්න
සහකාර කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**රචනය** :-

බී. ඒ. ජේ. එච්. බස්නායක
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
හාපිටිගම් ජාතික අධ්‍යාපන
විද්‍යාපීඨය

ඩබ්ලිව්. නිර්මලී නිරෝෂා
ගුණතිලක
කථිකාචාර්ය, හාපිටිගම්
ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය

අයි. එම්. ජී. ධර්මා රාජපක්ෂ
ගුරු උපදේශක, තඹුත්තේගම
කලාප අධ්‍යාපන කාර්යාලය

පී. ජේ. කලුආරච්චි
ගුරු උපදේශක (විශ්‍රාමික)

නිශ්ශංක බණ්ඩාර
ගුරු සේවය (විශ්‍රාමික)

ජේ. ඒ. ඒ. කේ. සේරම්
කථිකාචාර්ය, (ආරාධිත)
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

**සංස්කරණය** :-

**අභ්‍යන්තර** :-

රුවනි සිසිජා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව

ආචාර්ය, රාජකීය පණ්ඩිත පූජ්‍ය
වාවින්නේ පඤ්ඤානන්ද හිමි
සහකාර කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව

මදාරා ජයරත්න
සහකාර කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව

**බාහිර** :-

ශ්‍රියානි අබේවික්‍රම
ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන
සේවය I

එච්. පී. සුසිල් සිරිසේන
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
හාපිටිගම් ජාතික අධ්‍යාපන
විද්‍යාපීඨය

ඩබ්ලිව්. කරුණාරත්න
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ගුරු වෘත්තීය සංවර්ධන
මධ්‍යස්ථානය

ගයා වැයිහේන
ගුරු උපදේශක (විශ්‍රාමික)

**භාෂා සංස්කරණය** :-

ආචාර්ය පූජ්‍ය මොරකන්දේගොඩ
අරියවංස හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
රුහුණ විශ්වවිද්‍යාලය

**චිත්‍ර** :-

සමන් කලුබෝවිල
කථිකාචාර්ය
හාපිටිගම් ජාතික අධ්‍යාපන
විද්‍යාපීඨය

**විවිධ සහාය** :-

ආර්. එල්. ඩී. කේ. දයාසේන
ගුරු සේවය, සියලු සාන්තුවරයන්ගේ
විද්‍යාලය, කොළඹ 10

# හැඳින්වීම

භාෂාව සංස්කෘතියේ වාහකයා වේ. සිංහල සංස්කෘතිය මනාව වටහා ගැනීමටත් සංස්කෘතික උරුමක්කාරයින් ලෙස යථෝක්ත උරුමයන් අනාගත පරපුරට දායාද කිරීමටත් භාෂාව ඉගෙනීම ප්‍රයෝජනවත් වේ. සිංහල භාෂාව, විෂයක් ලෙස මෙන් ම අනෙක් විෂයන් ඉගෙන ගැනීමේ මාධ්‍යයක් ලෙස ද වැදගත් වේ.

2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන අධ්‍යාපන නව්‍යකරණවලට අනුව සකස් කරන ලද විෂයමාලාව කනිෂ්ඨ ද්විතීයික සහ ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ භාෂා කුසලතා හා සාහිත්‍ය රසඥතාව සංවර්ධනය කිරීම සඳහා භාෂා භාවිතය, වාක්කෝෂ සංවර්ධනය හා භාවිතය, භාෂා විග්‍රහය, රස වින්දනය හා විචාරය, නිර්මාණකරණය, විෂයාන්තර සමෝධානය යන කාර්ය සාධන ක්ෂේත්‍ර හයකින් යුක්ත ව සකස් කර ඇත. නව ඉගෙනුම් ක්‍රමවේද භාවිතයෙන් ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ භාෂා කුසලතා සංවර්ධනය කිරීමටත් නිර්මාණශීලී සහ ඵලදායී ඉගෙනුම් පරිසරයක් මෙන් ම සුතථ්‍ය ඉගෙනුම් අවස්ථා නිර්මාණය කිරීමටත් මෙම විෂයමාලාවෙන් අවධානය යොමු කර ඇත.

**මොඩියුල අංක 01** - 6 ශ්‍රේණියේ ''සුබස් මිහිර'' මොඩියුලය සකස් කර ඇත්තේ සවන් දීම හා කතා කිරීම යන භාෂා කුසලතා වර්ධනය කිරීම සඳහා ය. සවන් දීමේ හා කතා කිරීමේ කුසලතා මනා ලෙස වර්ධනය කර ගැනීම, අපට එදිනෙදා ජීවිතයේ ප්‍රායෝගික සන්නිවේදන අවස්ථාවලට සාර්ථක ව හා ආත්ම විශ්වාසයෙන් යුතු ව මුහුණ දීමට පහසුවක් වේ. මෙම මොඩියුලයෙහි සුහද සංවාද, දුරකතන සංවාද, මාතෘකානුකූල කතා සහ බහුමාධ්‍ය ඉදිරිපත් කිරීම් යන ඉගෙනුම් අවස්ථා අන්තර්ගත වේ.

**මොඩියුල අංක 02** - 6 ශ්‍රේණියේ ''සුබස් හුරුව 01'' මොඩියුලය සකස් කර ඇත්තේ කියවීම සහ ලිවීම යන භාෂා කුසලතා වර්ධනය කිරීම සඳහා ය. අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා නිර්මාණශීලී ව ප්‍රායෝගික ලේඛන සකස් කිරීමටත් වාක්කෝෂය සංවර්ධනය කර ගනිමින් ලේඛනයේ යෙදීමටත් මෙම මොඩියුලයේ දී අවස්ථාව ලබා දී ඇත. මෙම මොඩියුලයෙහි, සුබ පැතුම් පත්, ආරාධනා පත්‍ර සහ සමානාර්ථවත් පද යන ඉගෙනුම් අවස්ථා අන්තර්ගත වේ.

**මොඩියුල අංක 03** - 6 ශ්‍රේණියේ ''සාහිත මිහිර 01'' මොඩියුලය සකස් කර ඇත්තේ සවන් දීම, කතා කිරීම, කියවීම සහ ලිවීම යන භාෂා කුසලතා වර්ධනය කිරීම සඳහා ය. ජනකතා, කවි සහ ගීත යන සාහිත්‍ය නිර්මාණ අවධානයෙන් හා ජීවිතාවබෝධයෙන් යුතු ව කියවා රස විඳීමටත් ඒවා රස විඳීමෙන් අත්පත් කර ගත හැකි සමාජ සංවේදන කුසලතා වර්ධනය කර ගැනීමටත් සාහිත්‍ය කෘතියක් රසාස්වාදය කිරීමේ දී අනුගමනය කළ යුතු සරල මාර්ගෝපදේශ අවබෝධ කර ගැනීමටත් මෙම මොඩියුලයේ දී අවස්ථාව ලබා දී ඇත.

ප්‍රාථමික අවධියේ සිට ම නිවැරදි භාෂා භාවිතයට යොමු කිරීමත් සාහිත්‍ය පරිශීලනයට සහ රස වින්දනයට යොමු කිරීමත් විවිධ වෘත්තීන් වෙත එළඹුමට අත්‍යවශ්‍ය මෙවලමක් ලෙස සිංහල භාෂාව හා සාහිත්‍යය ඉගෙනීම වැදගත් වනු ඇත. 21 සියවසේ යහපත් සන්නිවේදකයකු ලෙස අනාගත ලෝකය යහපත් කරන පුරවැසියකු බිහි කිරීමට මෙම නව විෂයමාලාවෙන් දායකත්වය සැපයෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව පළමු වාරය සඳහා සම්පාදනය කරන ලද සුබස් මිහිර, සුබස් හුරුව 01 සහ සාහිත මිහිර 01 මොඩියුල තුන ඔබ අතට පත් කරන්නේ ඉමහත් සතුටිනි.

ආචාර්ය පූජ්‍ය කුකුරම්පොල ඥාණවිමල හිමි
අධ්‍යක්ෂ - සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන


**මොඩියුල අංක 01** - සුබස් මිහිර

1. සුහද සංවාද 01 - 06
2. දුරකතන සංවාද 07 - 12
3. මාතෘකානුකූල කතා 13 - 18
4. විවිධ මාධ්‍ය යොදා ගෙන සිදු කරන ඉදිරිපත් කිරීම් 19 - 25

**මොඩියුල අංක 02** - සුබස් හුරුව - 01

1. සුබ පැතුම් පත් සකසමු 27 - 33
2. ආරාධනා පත්‍ර නිර්මාණය කරමු 34 - 38
3. සමානාර්ථවත් පද හඳුනා ගනිමු 39 - 43

**මොඩියුල අංක 03** - සාහිත මිහිර -01

1. කතන්දර කියවමු - ගුණ නුවණ වඩවමු 45 - 51
2. කවි මිහිර විඳිමු 52 - 56
3. ගී මිහිර විඳිමු 57 - 64

## පළමු වාරය - මොඩියුල අංක 01

# සුබස් මිහිර

## ඉගෙනුම් අවස්ථාව 01



කාලච්ඡේද 01යි.

# සුහද සංවාද

මෙම ඉගෙනුම් අවස්ථාවේ දී;

- සුහද සංවාදවලට සවන් දීමටත්
- ඒ ඇසුරෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමටත්
- සුහද සංවාද සිදු කිරීමටත්

ඔබට හැකියාව ලැබෙනු ඇත.

### පෙර මතකය අවදි කරමු



දුවේ, පුතේ, ඔබ සංවාද අහලා ඇති නේ ද?
සංවාදවලට ප්‍රතිචාර දක්වලත් ඇති නේ ද?

- ඔබ අසා ඇති/සහභාගි වී ඇති සංවාද මොනවා ද?
- ඒ සංවාදවලට සහභාගි වූයේ කවුද?
- ඒ සංවාදවලින් ඔබ දැන ගත්තේ මොනවා ද?

එදිනෙදා ජීවිතයේ දී අපට සුහද සංවාදවලට සහභාගි වීමට සිදු වෙනවා. එවැනි අවස්ථා කිහිපයක් අපි හඳුනා ගනිමු.




සුහද සංවාද
දෙමාපියන් සමග
ගුරුවරුන් සමග
නෑදෑයින්/අසල්වාසීන් සමග
විදුහල්පතිතුමා සමග
පූජ්‍ය/පූජක පක්ෂය සමග
මිතුරු මිතුරියන් සමග

ඔබත් මෙවැනි සුහද සංවාදවලට සහභාගි වී තිබෙනවා ද? මේ එක් එක් සුහද සංවාදවල දී අපි ඒ ඒ අයට ඇමතීමට යොදන වචනත් කතාබහ කරන ආකාරයත් එකිනෙකට වෙනස් නේ ද? අපි ඒ වෙනස්කම් ගුරුතුමා/ගුරුතුමිය සමග සාකච්ඡා කරමු.

- ඔබේ ගුරුතුමා/ගුරුතුමිය ලබා දෙන සංවාදයට නිශ්ශබ්ද ව අවධානයෙන් සවන් දෙන්න.




**පහත කරුණු හිතට අරන් සංවාදය අහන් ඉන්න**



- සුහද සංවාදයට සවන් දීමට සූදානම් වන්න.
- ඔබේ මිතුරු මිතුරියන්ට බාධා නොවන සේ සංවාදයට සවන් දෙන්න.
- නැවත වරක් සවන් දෙන්න.
- සංවාදයට සවන් දෙන අතර පහත ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

## ක්‍රියාකාරකම 1.1

නිවැරදි පිළිතුරට අදාළ අංකය රවුම් කරන්න.

1. සංවාදය සිදු වන්නේ කා අතර ද?



i



ii



iii

2. පරණ බඩු කාමරයේ සීයා සොයන්නේ මොනවා ද?



i



ii



iii

3. එදිනෙදා ................. ආහාර අපට ගෙදර දී ම වවා ගන්න පුළුවන් නම්...
   i. ආහාරයට ගන්නා ii. පරිභෝජනය කරන
   iii. භාවිත කරන

4. ඒක අපේ ................. යහපත් ව පවත්වා ගන්න ගොඩක් වැදගත් වෙනවා.
   i. සෞඛ්‍යය ii. පෝෂණය iii. නීරෝගී සුවය

5. කුස්සියේ ඉවත දමන දේවලින් සකස් කර ගත හැක්කේ මොනවා ද?
   i. කෘමිනාශක ii. කාබනික පොහොර
   iii. දියර පොහොර

6. අපට අවශ්‍ය දේ අපි ම වගා කර ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජනය කුමක් ද?
   i. මුදල් ඉතුරු වීම ii. කාලය ඉතුරු වීම
   iii. අමතර ආදායමක් ලැබීම

7. සංවාදයේ දී කතා කරන්නේ කුමක් ගැන ද?
   i. අඩු ඉඩක වගා කිරීම ii. එළවළු පලතුරු පිටරටින් ගෙන්වීම
   iii. ආහාර වර්ග කල්තබා ගැනීම

ඔබගේ හැකියාව ඔබ ම හඳුනා ගන්න.
ඔබගේ හැකියාවට අදාළ තරුව පාට කරන්න.

| නිවැරදි ව පිළිතුරු ලබා දෙන්න මට පුළුවන් | පළමු ප්‍රශ්නය | දෙවන ප්‍රශ්නය | තෙවන ප්‍රශ්නය | හතර වන ප්‍රශ්නය | පස් වන ප්‍රශ්නය | හය වන ප්‍රශ්නය | හත් වන ප්‍රශ්නය |
|---|---|---|---|---|---|---|---|
| | ☆ | ☆ | ☆ | ☆ | ☆ | ☆ | ☆ |

**වැඩිදුර ඉගෙනුම සඳහා**

## ක්‍රියාකාරකම 1.2

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් වන්න.
- ඔබේ ගුරුතුමා/ගුරුතුමිය ලබා දෙන අවස්ථා අනුව සුහද සංවාදයක් ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- කණ්ඩායමේ සාමාජිකයන් එක් ව සුහද සංවාදයක් ගොඩනගා ගන්න.
- භූමිකා රංගනයකින් එම සංවාදය පන්තියට ඉදිරිපත් කරන්න.
- ඔබ එදිනෙදා ජීවිතයේ සුහද සංවාදවල දී ආචාරශීලී ව සහ සංයමයෙන් කතා කිරීමට පුහුණු වන්න.

**සවන් දීමේ පුහුණුව ලබා ගැනීම සඳහා QR කේතය යොදා ගන්න.**

Channel NIE

## ඉගෙනුම් අවස්ථාව 02



කාලච්ඡේද 02යි.

# දුරකතන සංවාද

මෙම ඉගෙනුම් අවස්ථාවේ දී;

- දුරකතන සංවාදයකට සවන් දීමටත්
- දුරකතන ඇමතුම් ලබා දීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හඳුනා ගැනීමටත්
- දුරකතන ඇමතුම්වලට පිළිතුරු දීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හඳුනා ගැනීමටත්
- නිවැරදි ව දුරකතන සංවාදවල නිරත වීමටත්

ඔබට හැකියාව ලැබෙනු ඇත.

### පෙර මතකය අවදි කරමු



මේ ප්‍රශ්නවලට පිළිතුරු කියන්න.

- ඔබට දුරකතන ඇමතුම් ලැබී තිබේ ද?
- ඔබ දුරකතන ඇමතුම් ලබා ගෙන තිබේ ද?
- යාළුවකුගෙන් හා ගුරුවරයකුගෙන් ලැබෙන ඇමතුම්වල වෙනස්කම් මොනවා ද?
- දුරකතන ඇමතුමක් ලබා දීමේ දී ඔබ සැලකිල්ලට ගන්නා කරුණු මොනවා ද?





එදිනෙදා ජීවිතයේ දී විවිධ අවශ්‍යතා සඳහා දුරකතන ඇමතුම් ලබා ගැනීමටත් දුරකතන ඇමතුම්වලට සවන් දීමටත් ප්‍රතිචාර දැක්වීමටත් අපට සිදු වෙනවා. දුරකතන සංවාදයකට දෙපාර්ශ්වයක් ඉන්න ඕනෑ.

1. ඇමතුම ලබා දෙන තැනැත්තා
2. ඇමතුමට පිළිතුරු දෙන තැනැත්තා

දුරකතන සංවාදයක යෙදීමේ දී සහ ප්‍රතිචාර දැක්වීමේ දී අවධානයට ගත යුතු කරුණු කිහිපයක් තියෙනවා.

## සැලකිලිමත් විය යුතු කරුණු

**ඇමතුම ලබා දෙන්නා සැලකිලිමත් විය යුතු කරුණු**

- සුබ පැතීම සහ තමා හඳුන්වා දීම
- ආචාරශීලී ව කතා කිරීම
- ඇමතුම පවත්වා ගෙන යාමට අවසර පැතීම
- තම අවශ්‍යතාව කෙටියෙන් පැවසීම
- අත්‍යවශ්‍ය කරුණු පමණක් පැවසීම
- ආචාරශීලී ව ඇමතුම අවසන් කිරීම සහ ආශිර්වාද කිරීම



**ඇමතුමට ප්‍රතිචාර දක්වන්නා සැලකිලිමත් විය යුතු කරුණු**

- දුරකතනය තුන් වරක් නාද වීමට පෙර ප්‍රතිචාර දැක්වීම
- සුබ පැතීම සහ ආචාරශීලී ව ඇමතීම
- අවශ්‍යතාව විමසීම
- අවධානයෙන් සවන් දීම
- අදාළ තොරතුරු කෙටියෙන් ලබා දීම
- ආචාරශීලී ව ඇමතුම අවසන් කිරීම සහ ආශිර්වාද කිරීම



**පටිගත කරන ලද දුරකතන සංවාදයකට අපි දැන් අවධානයෙන් සවන් දෙමු. සවන් දෙන අතර පහත ප්‍රශ්නවලට ද පිළිතුරු සලකුණු කරමු.**

**ක්‍රියාකාරකම 2.1**

නිවැරදි පිළිතුරට අදාළ අංකය රවුම් කරන්න.

1. දුරකතන ඇමතුම ලබා ගන්නේ කවුද?





i. දසුන් ii. නිපුන් iii. සුපුන්

2. දුරකතන ඇමතුම ලබා දෙන්නා ඉගෙනුම ලබන ශ්‍රේණිය කුමක් ද?

i. 7 ශ්‍රේණිය ii. 6 ශ්‍රේණිය iii. 10 ශ්‍රේණිය

3. දුරකතන ඇමතුමෙන් දැන ගැනීමට අවශ්‍ය මොනවා ද?

i. කාබනික පොහොර ගැන

ii. ගෙවතු වගාව ගැන

iii. වී වගාව ගැන

4. බීජ වර්ග මිල දී ගැනීමට බලාපොරොත්තු වන්නේ කුමන ස්ථානයකින් ද?

i. ග්‍රාම නිලධාරි කාර්යාලයෙන්

ii. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන්

iii. ගොවිජන සේවා කාර්යාලයෙන්

5. පලතුරු වවනවා නම් අපට ................ ගන්න වෙනවා.

i. බීජ පැළ ii. බද්ධ පැළ iii. ඔසු පැළ

6. පුතා ආවොත් අපිට පුතාට .................................. වගාවක් කරන විදිය ප්‍රායෝගික ව කරලා පෙන්වන්න පුළුවන්.

i. අතුරු බෝග

ii. බඳුන් ගත

iii. මිශ්‍ර භෝග

ඔබගේ හැකියාව ඔබ ම හඳුනා ගන්න.
ඔබගේ හැකියාවට අදාළ තරුව පාට කරන්න.

| නිවැරදි ව පිළිතුරු ලබා දෙන්න මට පුළුවන් | පළමු ප්‍රශ්නය | දෙවන ප්‍රශ්නය | තෙවන ප්‍රශ්නය | හතර වන ප්‍රශ්නය | පස් වන ප්‍රශ්නය | හය වන ප්‍රශ්නය |
|---|---|---|---|---|---|---|
| | ☆ | ☆ | ☆ | ☆ | ☆ | ☆ |

## ක්‍රියාකාරකම 2.2



- දුරකතන සංවාදයක් සඳහා ඔබ කැමති අවස්ථාවක් තෝරා ගන්න (මේ සඳහා ගුරු උපදෙස් ලබා ගන්න).
- දෙදෙනා බැගින් කණ්ඩායම්වලට වෙන් වන්න.
- දෙදෙනා එක් ව මිනිත්තු තුනක පමණ දුරකතන සංවාදයක් ගොඩනගා ගන්න.
- එම සංවාදය භූමිකා රංගනයක් මගින් ඉදිරිපත් කරන්න.

## ඔබගේ හැකියාව ඔබ ම හඳුනා ගන්න.

**ඔබ ඇමතුම ලබා දෙන්නා ලෙස පහත කරුණු අනුගමනය කළේ නම් අදාළ තරුව/තරු පාට කරන්න.**

| | |
|---|---|
| ඇමතුම ලබා දීමේ දී සුබ පතමින් ආචාරශීලී ව ආමන්ත්‍රණය කළා. | ☆ |
| තමා කවුරුන් දැයි හඳුන්වා දුන්නා. | ☆ |
| ඇමතුම පවත්වා ගෙන යාම සඳහා අවසර ලබා ගත්තා. | ☆ |
| ඇමතුම ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කළා. | ☆ |
| සංයමයෙන් හා ආචාරශීලී ව කතා කළා. | ☆ |
| අත්‍යවශ්‍ය කරුණු පමණක් ඉදිරිපත් කළා. | ☆ |
| ආශිර්වාද කරමින් ආචාරශීලී ව ඇමතුම අවසන් කළා. | ☆ |

**ඔබ ඇමතුමට ප්‍රතිචාර දක්වන්නා ලෙස පහත කරුණු අනුගමනය කළේ නම් අදාළ තරුව/තරු පාට කරන්න.**

| | |
|---|---|
| දුරකතනය තුන් වරක් නාද වීමට පෙර ප්‍රතිචාර දැක්වූවා. | ☆ |
| සුබ පතමින් ආචාරශීලී ව ආමන්ත්‍රණය කළා. | ☆ |
| අවශ්‍යතාව විමසුවා. | ☆ |
| අවධානයෙන් යුතු ව සවන් දුන්නා. | ☆ |
| අදාළ තොරතුරු සංක්ෂිප්ත ව ලබා දුන්නා. | ☆ |
| ආශිර්වාද කරමින් ආචාරශීලී ව ඇමතුම අවසන් කළා. | ☆ |

**වැඩිදුර ඉගෙනුම සඳහා**

සවන් දීමේ පුහුණුව ලබා ගැනීම සඳහා QR කේතය යොදා ගන්න.

Channel NIE



කාලච්ඡේද 04යි.

## ඉගෙනුම් අවස්ථාව 03

# මාතෘකානුකූල කතා

මෙම ඉගෙනුම් අවස්ථාවේ දී ඔබට මාතෘකා අනුව
- හරවත් කරුණු ඉදිරිපත් කරමින් කතා කිරීමට
- මනා සැලසුමකින් යුතු ව කතා කිරීමට
- නිවැරදි ව වචන උච්චාරණය කරමින් කතා කිරීමට
- සබකෝලයෙන් තොර ව කතා කිරීමට

පුහුණුව ලැබෙනු ඇත.

### පෙර මතකය අවදි කරමු



මේ ප්‍රශ්නවලට පිළිතුරු කියන්න.

1. මීට පෙර ඔබ මාතෘකානුකූල කතාවක් අසා තිබේ ද?
2. ඒ කුමක් ගැන ද?

මාතෘකානුකූල කතා පිළිබඳ පහත කරුණු ඔබේ ගුරුතුමා/ගුරුතුමිය සමග සාකච්ඡා කරන්න.

- මාතෘකානුකූල කතාවක් යනු කුමක් ද?
- මාතෘකානුකූල කතාවක් පැවැත්වීමට සිදු වන අවස්ථා
- මාතෘකානුකූල කතාවක් පැවැත්වීමේ දී වර්ධනය කර ගත යුතු කුසලතා
- ආකර්ෂණීය ව කතා කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන
- හරවත් කතාවලට සවන් දීමේ ප්‍රයෝජන

අද අපි මාතෘකාවකට අදාළ ව සිදු කරන කතාවකට සවන් දෙමු; නරඹමු; කතාව ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සොයමු.

**ක්‍රියාකාරකම 3.1**

**නිවැරදි පිළිතුරට අදාළ අංකය රවුම් කරන්න.**

1. කතාවේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකාවේ වර්ග කිලෝමීටර් ගණන කීයද?
   i. වර්ග කිලෝමීටර් 65625
   ii. වර්ග කිලෝමීටර් 65510
   iii. වර්ග කිලෝමීටර් 65610

2. මේ අතරින් කතාවේ සඳහන් නොවන නම කුමක් ද?
   i. සෙරන්ඩිබ්
   ii. තැප්‍රොබේන්
   iii. සෙයිලාවේ

3. කතාවේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය ලෙස හැඳින්වීමට හේතුව කුමක් ද?
   i. ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂිත වීම නිසා
   ii. ශ්‍රී ලංකාව කුරක්කන් පිටරට යැවූ නිසා
   iii. ශ්‍රී ලංකාවේ තිරිඟු වගා කරන නිසා

4. කතාවේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකාව සංචාරක ආකර්ෂණයට ලක් වීමට හේතුව වන්නේ මින් කුමක් ද?
   i. ශ්‍රී ලංකාවේ රසවත් ආහාර තිබෙන නිසා
   ii. ශ්‍රී ලංකාවේ ස්වාභාවික සුන්දරත්වය සහ ආගන්තුක සත්කාර නිසා
   iii. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගත ව පිහිටීම නිසා

5. දී ඇති වචනයට කතාවේ යෙදී ඇති විරුද්ධ වචනය තෝරන්න.

   | ආනයනය |
   |---|

   i. සංවර්ධනය   ii. අපනයනය   iii. ආයෝජනය

6. දී ඇති වචනයට කතාවේ යෙදී ඇති සමානාර්ථයක් දෙන වචනය තෝරන්න.

   | උදාර |
   |---|

   i. ප්‍රෞඪ   ii. ප්‍රබල   iii. ඓතිහාසික

ඔබගේ හැකියාව ඔබ ම හඳුනා ගන්න.
ඔබගේ හැකියාවට අදාළ තරුව පාට කරන්න.

| නිවැරදි ව පිළිතුරු ලබා දෙන්න මට පුළුවන් | පළමු ප්‍රශ්නය | දෙවන ප්‍රශ්නය | තෙවන ප්‍රශ්නය | හතර වන ප්‍රශ්නය | පස් වන ප්‍රශ්නය | හය වන ප්‍රශ්නය |
|---|---|---|---|---|---|---|
| | ☆ | ☆ | ☆ | ☆ | ☆ | ☆ |

## කතා සැකිලි කිහිපයක් කියවමු

★ කතාවක් පැවැත්වීමේ දී කතා සැකිල්ලක් නිර්මාණය කළොත් හරවත් කතාවක් ගොඩනගා ගන්න පුළුවන්.

**පරිසරය සුරකිමු**

- නිර්මාණශීලී ව කතාව ආරම්භ කිරීම (කවියක්/උපුටා ගත් යෙදුමක්/කියමනක්)
- පරිසරය හැඳින්වීම
- පරිසරයෙන් අපට ලැබෙන ප්‍රයෝජන
- පරිසරය විනාශ වන ආකාරය
- පරිසරය විනාශ කිරීමෙන් සිදු වන හානිය
- පරිසර විනාශය නැවැත්වීමට කළ හැකි දේ
- කතාව අවසන් කිරීම

**සාරධර්ම සුරකිමු**

- නිර්මාණශීලී ව කතාව ආරම්භ කිරීම (කවියක්/රුවන් වැකියක්)
- සාරධර්ම පිළිබඳ කෙටියෙන් පැහැදිලි කිරීම
- සාරධර්ම සුරැකීමෙන් සමාජයට සිදු වන යහපත
- සාරධර්ම නැති වුවහොත් සමාජයට වන හානි
- සාරධර්ම සුරැකීමට කළ හැකි දෑ
- කතාව අවසන් කිරීම

**මා කැමති ම ලේඛකයා/ලේඛිකාව**

- එම ලේඛකයා/ලේඛිකාව පිළිබඳ රසවත් තොරතුරකින් කතාව ආරම්භ කිරීම
- ඔහුගේ/ඇයගේ ජීවිතයේ වැදගත් තොරතුරු
- ඔහු/ඇය ලියූ පොත්පත්
- කැමති ම පොත
- එතුමාගෙන්/එතුමියගෙන් අප ජීවිතයට ගත හැකි ආදර්ශ
- කතාව අවසන් කිරීම

**අපි දැන් මාතෘකානුකූල කතාවකට සැකිල්ලක් ගොඩනගමු.**

## ක්‍රියාකාරකම 3.2

- කියවීමේ වැදගත්කම යන මාතෘකාව යටතේ මාතෘකානුකූල කතාවක් පැවැත්වීමට කතා සැකිල්ලක් ගොඩනගන්න.

**මාතෘකානුකූල කතාවක් පැවැත්වීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු අපි හඳුනා ගනිමු.**

01. අවසර ගැනීම
02. කරුණු හොඳින් පෙළ ගස්වා ගැනීම
03. මාතෘකාවට අදාළ ව කතා කිරීම
04. නිවැරදි ව තොරතුරු ඉදිරිපත් කිරීම
05. සිත් ගන්නා රසවත් තොරතුරු ඉදිරිපත් කිරීම
06. සංයමයෙන් කතා කිරීම
07. ගැළපෙන පරිදි විරාම තබමින් කතා කිරීම
08. ගැළපෙන පරිදි ශබ්දනගා කතා කිරීම
09. කටහඬ උචිත ලෙස පාලනය කිරීම
10. ගැළපෙන අංගචලන යොදා ගැනීම
11. කාලය ගැන සැලකිලිමත් වීම
12. කතාව හොඳින් අවසන් කිරීම

## ක්‍රියාකාරකම - 3.3

මාතෘකානුකූල කතාවලට පෙර පුහුණුවක් ලෙස 'කතා මාලය' ක්‍රියාකාරකමෙහි ගුරු උපදෙස් අනුව නිරත වන්න.



## හඬ අවදි කරමු



- පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගන්න.
  - පරිසරය සුරකිමු
  - මා කැමති ම වීරයා
  - වවන්නෝ දිනන්නෝ
  - මට පියාපත් ලැබුණොත්
  - මම ගංගාවක් වෙමි

- මාතෘකාවට අදාළ ව කරුණු රැස් කර ගන්න.

  (පොත්වලින්, සඟරා හා පුවත්පත්වලින්, රූපවාහිනියෙන්, ගුවන්විදුලියෙන් හා අන්තර්ජාලයෙන්, වැඩිහිටියන්ගෙන්, ගුරුවරුන්ගෙන්)

- කතාව ඉදිරිපත් කිරීමට පෙර සැකිල්ලක් සකස් කරන්න.
- සකස් කළ සැකිල්ල ගුරුතුමාට/ගුරුතුමියට පෙන්වන්න.
- මිනිත්තු තුනක පමණ කතාවක් ඉදිරිපත් කරන්න.
- පන්තියේ මිතුරු මිතුරියන් ඉදිරිපත් කරන කතාවලට සවන් දී එම කතා පිළිබඳ ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.

## ඔබගේ හැකියාව ඔබ ම හඳුනා ගන්න.
## පහත හැකියා ඔබට තිබේ නම් අදාළ තරුව පාට කරන්න.

| | |
|---|---|
| මෙම මාතෘකාවට අදාළ ව හරවත් කරුණු ඉදිරිපත් කරන්න මට පුළුවන් | ☆ |
| සුදුසු වචන මාලාවක් යොදා ගෙන කතා කරන්න මට පුළුවන් | ☆ |
| වචන නිවැරදි ව උච්චාරණය කරමින් කතා කරන්න මට පුළුවන් | ☆ |
| කාලය කළමනාකරණය කර ගන්න මට පුළුවන් | ☆ |
| කතාවේ මුල, මැද, අග ගළපමින් කතා කරන්න මට පුළුවන් | ☆ |

### වැඩිදුර ඉගෙනුම සඳහා

- ★ මාතෘකානුකූල ව කතා කිරීමේ හැකියාව වර්ධනය කර ගැනීම සඳහා අන්තර්ජාලයට පිවිස ලෝකයේ විවිධ දේශකයන්/කථිකයන් ඉදිරිපත් කරන කතා අසන්න/නරඹන්න.
- ★ එම කථිකයන්ගේ කතාවේ ඇතුළත් කරුණු පෙළ ගස්වා ගැනීම සහ නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම, පැහැදිලි ව සහ නිරවුල් හඬ පාලනය කරමින් සුදුසු අංග චලන යොදා ගනිමින් කතා කිරීම වැනි විශේෂ ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කරන්න.
- ★ එම කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් මාතෘකානුකූල ව කතා කිරීමේ කුසලතාව සංවර්ධනය කර ගන්න.

පාසලේ උදෑසන රැස්වීම, සාහිත්‍ය සමිතිය, ආගමික සංගමය සහ ක්‍රීඩා සංගමය ආදි අවස්ථාවල දී මාතෘකානුකූල කතා ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ඉගෙනුම් අවස්ථාව 04



කාලච්ඡේද 05යි.

# විවිධ මාධ්‍ය යොදා ගෙන සිදු කරන ඉදිරිපත් කිරීම්

මෙම ඉගෙනුම් අවස්ථාවේ දී;

- විවිධ මාධ්‍ය යොදා ගෙන සිදු කරන ඉදිරිපත් කිරීම් (Presentations) ගැන දැන ගැනීමටත්
- ඉදිරිපත් කිරීම් සඳහා යොදා ගත හැකි විවිධ මාධ්‍ය හඳුනා ගැනීමටත්
- ඉදිරිපත් කිරීමක දී සැලකිලිමත් විය යුතු කරුණු හඳුනා ගැනීමටත්
- විවිධ මාධ්‍ය යොදා ගෙන ඉදිරිපත් කිරීම් සිදු කිරීමටත්

ඔබට අවස්ථාව ලැබෙනු ඇත.



අසමු



බලමු



සිතමු



කරමු

තොරතුරු අන් අයට ඉදිරිපත් කිරීමේ දී අපට විවිධ මාධ්‍ය යොදා ගන්න පුළුවන්. කථනය, ගායනය, නර්තනය, භූමිකා රංගනය, චිත්‍ර, පෝස්ටර්, වීඩියෝ දර්ශන වගේ මාධ්‍ය අපට නිර්මාණශීලී ව භාවිත කරන්න පුළුවන්. එක් මාධ්‍යයක් භාවිත කරනවාට වඩා මාධ්‍ය කිහිපයක් යොදා ගනිමින් ඉදිරිපත් කිරීමක් කරන්න පුළුවන් නම් එය වඩාත් ආකර්ෂණීය වෙවි.

### පෙර මතකය අවදි කරමු



- ඔබේ සිත් ගත් වීඩියෝ දර්ශනයක්, කතාවක්/භූමිකා රංගනයක් ආදි ඉදිරිපත් කිරීම් මතකයට ගන්න.
- එම ඉදිරිපත් කිරීම් ඔබේ සිත් ගැනීමට හේතු වූ කරුණු කියන්න.



කථනය



ගායනය



වීඩියෝ දර්ශන

# විවිධ මාධ්‍ය යොදා ගෙන ඉදිරිපත් කිරීම් සිදු කරමු



නර්තනය




පෝස්ටර්



චිත්‍ර



භූමිකා රංගන

# පිටු පෙරළනයක් (Flip chart) යොදා ගනිමින් තොරතුරු ඉදිරිපත් කරමු




පිටු පෙරළනය (Flip chart) තොරතුරු ඉදිරිපත් කිරීමට භාවිත කරන මෙවලමකි.

- ඉදිරිපත් කිරීමේ දී පිටුවෙන් පිටුව පෙරළමින් තොරතුරු ඉදිරිපත් කළ හැකි ආකාරයෙන් මෙය සකස් කර ඇත.
- මාතෘකාවට අනුව පිටුවෙන් පිටුව පෙළ ගස්වයි.
- තොරතුරුවලට අදාළ චිත්‍ර/සටහන් නරඹන්නන්ට පෙනෙන ලෙස ඉදිරිපත් කරයි.
- ප්‍රමාණයෙන් තරමක් විශාල කොළ භාවිත කරයි.
- පිටු පෙරළනය සඳහා ඩිමයි කොළ/ඉවත දමන කැලැන්ඩර් කොළ ආදිය භාවිතයට ගැනෙයි.
- තොරතුරු පැහැදිලි ව හා කෙටියෙන් සඳහන් කරයි.

- ඉදිරිපත් කිරීම හොඳින් දර්ශනය වන සුදුසු ස්ථානයක අසුන් ගන්න.
- වෙනත් කාර්යන්හි නො යෙදෙන්න.
- මුල සිට අග දක්වා අවධානය රඳවා ගන්න.
- ඉදිරිපත් කිරීම ඇසුරින් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

**ක්‍රියාකාරකම 4.1**

ඉදිරිපත් කිරීමට සවන් දී නිවැරදි අංකය තෝරා රවුම් කරන්න.

1. පිටු පෙරළනයේ සඳහන් වන්නේ කුමක් ගැන ද?
   i. පලතුරු බීම ii. කැඳ iii. සුප්

2. කවිය සම්පූර්ණ කරන්න.

   පෙනුම වඩන i. ..................... විෂ නසනවා ii. ......................
   මන වඩනා මතක දෙනා - ගොටුකොළ සුව සහන ගෙනා

3. කොටුව තුළ ඇති අදහසට සමාන අදහස දෙන පිළිතුර තෝරන්න.

   නිම්නැත

   i. නිම්නයක් නැත ii. අවසානයක් නැත iii. නිදහසක් නැත

   මුසු කර

   i. උකු කර ii. දිය කර iii. මිශ්‍ර කර

4. මෙම ඉදිරිපත් කිරීමේ ඇතුළත් නොවන බීම වර්ගය කුමක් ද?
   i. බැදි හාල් කැඳ ii. එළවළු සුප් iii. සව් කැඳ

5. වැරදි අදහස තෝරන්න.
   i. කොළ කැඳ ගෙදර දී ම සාදා ගන්න පුළුවන්.
   ii. රෝගීන්ට කැඳ වර්ග සුදුසු නො වේ.
   iii. දිනපතා කැඳ බීම හොඳ පුරුද්දකි.

ඔබගේ හැකියාව ඔබ ම හඳුනා ගන්න.
ඔබගේ හැකියාවට අදාළ තරුව පාට කරන්න.

| නිවැරදි ව පිළිතුරු ලබා දෙන්න මට පුළුවන් | පළමු ප්‍රශ්නය | දෙවන ප්‍රශ්නය | තෙවන ප්‍රශ්නය | හතර වන ප්‍රශ්නය | පස් වන ප්‍රශ්නය |
|---|---|---|---|---|---|
| | ☆ | ☆ | ☆ | ☆ | ☆ |

## ක්‍රියාකාරකම 4.2

### ඉදිරිපත් කිරීම් සඳහා පෙර සූදානම

- පහත මාතෘකාවලින් ඔබ වඩාත් කැමති මාතෘකාවක් තෝරා ගන්න.



**බහුමාධ්‍ය ඉදිරිපත් කිරීම් සඳහා ආදර්ශ මාතෘකා**

- නව නිපැයුමක් හඳුනා ගනිමු
- පොලිතීන් භාවිතය අවම කරමු
- මා සිත් ගත් ලේඛකයා/ලේඛිකාව
- සිංහල-හින්දු අලුත් අවුරුද්ද/නත්තල් උත්සවය/රාමසාන් උත්සවය

- ඉදිරිපත් කිරීමට ඔබ කැමති මාධ්‍ය දෙකක් හෝ කිහිපයක් තෝරා ගන්න.
- මිනිත්තු පහක ඉදිරිපත් කිරීමක් සඳහා සැලසුමක් සකස් කරන්න.
- ඔබ සකස් කළ සැලසුම ගුරුතුමා/ගුරුතුමියට පෙන්වන්න.
- ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය උපකරණ සහ මෙවලම් සූදානම් කර ගන්න.
- පිටු පෙරළනයට අමතර ව සුහුරු පුවරුව, (Smart Board) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය (Multimedia Projector) පරිගණකය වැනි උපකරණ ද මේ සඳහා යොදා ගත හැකි ය.
- නියමිත කාලය ඇතුළත ඔබේ ඉදිරිපත් කිරීම සිදු කරන්න.
  (එක් ඉදිරිපත් කිරීමක් සඳහා ලැබෙන කාලය මිනිත්තු තුනකි.)
- ප්‍රියමනාප ලෙස කතා කරන්න.
- නිවැරදි ව හා පැහැදිලි ව කතා කරන්න.
- කරුණු නිවැරදි ව ඉදිරිපත් කරන්න.



- සුදුසු අවස්ථාවේ දී විවිධ මාධ්‍ය යොදා ගන්න.
- පන්තියේ මිතුරු මිතුරියන්ගේ ඉදිරිපත් කිරීම් පිළිබඳ ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.

## ඔබගේ හැකියාව ඔබ ම අගයන්න.
## ඔබේ හැකියාවට අදාළ කොටුවේ හරි ලකුණ (✓) යොදන්න.

| මගේ හැකියාව | ඉතා හොඳයි | හොඳයි | තරමක් හොඳයි |
|---|---|---|---|
| බහුමාධ්‍ය ඉදිරිපත් කිරීමක් සඳහා සැලසුමක් සකස් කිරීමට මට හැකි ය. | | | |
| අවශ්‍ය මෙවලම් සකස් කිරීමට මට හැකි ය. | | | |
| ගැළපෙන මාධ්‍ය දෙකක්වත් භාවිත කිරීමට මට හැකි ය. | | | |
| නිරවුල් ව හා පැහැදිලි ව කතා කිරීමට මට හැකි ය. | | | |
| නිවැරදි ව භාෂාව භාවිත කිරීමට මට හැකි ය. | | | |
| කාලය කළමනාකරණය කර ගැනීමට මට හැකි ය. | | | |

### වැඩිදුර ඉගෙනුම සඳහා

මඩොල්දූව කෘතිය පිළිබඳ බහුමාධ්‍ය ඉදිරිපත් කිරීමක් නැරඹීම සඳහා QR කේතය යොදා ගන්න.

ChannelNIE

★ සුහුරු පුවරුව, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය වැනි නවීන තාක්ෂණික මෙවලම් යොදා ගෙන ඉදිරිපත් කිරීම් සිදු කරන ආකාරය ද පුහුණු වන්න.

## උගත් දේ සිහි කරමු

**අපි මේ මොඩියුලයෙන් ඉගෙන ගත් කරුණු පිළිබඳ නැවත මතක් කර ගනිමු.**

ෆාතිමා: මට මතකයි අපි නිවැරදි ව සුහද සංවාදවලත් දුරකතන සංවාදවලත් යෙදෙන ආකාරය ඉගෙන ගත්තා. ඒ වගේ ම සංවාදවල දී අපි සැලකිලිමත් විය යුතු කරුණු ගැනත් ඉගෙන ගත්තා.

නිපුණ : ඔව්, අපි දැන් උත්සාහ කරන්න ඕනෙ ඉගෙන ගත්ත කරුණු අනුව ආචාරශීලී ව සහ සංයමයෙන් සංවාදවල යෙදෙන්න.

ෆාතිමා: ඇයි දැන් අපිට පුළුවන් නේද මාතෘකාවකට අනුව කරුණු සංවිධානය කර ගෙන කතා කරන්න?

නිපුණ : කථික තරගවලට යන කොට අපට ඒ පුහුණුව ගොඩක් වැදගත් වෙනවා.

ෆාතිමා: මම ගොඩක් ම කැමති බහුමාධ්‍ය ඉදිරිපත් කිරීම්වලට. අපිට නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම් කරන්න වගේ ම මාධ්‍ය කීපයක් භාවිත කරන්නත් පුහුණුව ලැබුණා. අපිට ඒ දේවල් යොදා ගෙන නිර්මාණශීලී ඉදිරිපත් කිරීම් කරන්න පුළුවන් නේද?

සරෝජා : අපිට පුළුවන් අපේ නිර්මාණශීලී පටිගත කිරීම් අන්තර්ජාලයට යොමු කරන්න.

ෆාතිමා: අපි හැම වෙලාවක ම උත්සාහ කරන්න ඕනෙ මේ ඉගෙන ගත්ත දේවල් ප්‍රායෝගික ව අපේ ජීවිතයේ දී යොදා ගන්න.

## අර්ථය හඳුනා ගනිමු

| | |
|---|---|
| භූමිකා රංගන | චරිතයක් රඟ දැක්වීම |
| සංවාදය | දෙදෙනෙකු අතර කරන කතාබහ/දෙබස් |
| මාතෘකානුකූල | මාතෘකාවට අදාළ |
| කතා සැකිල්ල | කතාවක දළ සැලැස්ම |
| හරවත් | අර්ථවත් |
| ආකර්ෂණීය | සිත් ඇදගන්නාසුලු |

## පළමු වාරය - මොඩියුල අංක 02

# සුබස් හුරුව - 01

ඉගෙනුම් අවස්ථාව 01



# සුබ පැතුම් පත් සකසමු

කාලච්ඡේද 04යි.

මෙම ඉගෙනුම් අවස්ථාවේ දී;
- සුබ පැතුම් පතක ලක්ෂණ හඳුනා ගැනීමටත්
- විවිධ සුබ පැතුම් පත් වර්ග හා ඒවා භාවිත වන අවස්ථා හඳුනා ගැනීමටත්
- නිර්මාණශීලී ලෙස නිවැරදි ව භාෂාව භාවිත කරමින් සුබ පැතුම් පත් නිර්මාණය කිරීමටත්

ඔබට අවස්ථාව ලැබෙනු ඇත.

## පෙර මතකය අවදි කරමු



- ඔබ සුබ පැතුම් පත් දැක තිබේ ද?
- ඔබට සුබ පැතුම් පත් ලැබී තිබේ ද?
- ඔබට සුබ පැතුම් පත් ලැබුණු අවස්ථා මොනවා ද?
- සුබ පැතුම් පතක ඔබ දුටු ලක්ෂණයක් කියන්න.

## සුබ පැතුම් පත් භාවිත වන අවස්ථා අපි හඳුනා ගනිමු

උපන් දින, නව වසර උදා වීම, අලුත් අවුරුද්ද, ජයග්‍රහණ, විවිධ සැමරුම්, ආගමික උත්සව, ළමා දිනය, ගුරු දිනය, වැඩිහිටි දිනය ආදි සුවිශේෂ දින



අපි දැන් සුබ පැතුම් පත් කිහිපයක් කියවමු.

★ මේ එක් එක් සුබ පැතුම් පත්වල ඔබ දකින විශේෂතා මොනවා ද?

★ එම සුබ පැතුම් පත් යොදා ගත හැකි අවස්ථා මොනවා ද?


පතන සුබ පැතුම් සැම විට ඉටු වේවා
තබන තබන පිය ජය මග හෙළි වේවා
ජය සතුට පිරි
සුබ උපන් දිනයක් වේවා!
...................... විසින්
...................... වෙත


ලබන්නා වූ නව වසර ඔබටත් ඔබේ පවුලේ
සියලු දෙනාටත් ප්‍රීතිමත් නීරෝගී
වාසනාවන්ත වසරක් වේවා!
...................... විසින්
...................... වෙත


මගෙ යළුවෙ මේ අහන්න
බාධක මැඩ පෙරට එන්න
හෙට දිනයේ ලොව දිනන්න
උපන් දිනයෙ සිතට ගන්න
සිතුම් ................................ විසින්
සඳෙව් ................................ වෙත


උගතුන් සභා මැද වැජඹෙන්නට දිරි දී
සිප් කිරි පෙවූ ගුරු මවුනි පියාණනි
නිදුක් නීරෝගී දිවියකට
මේ ගුරු දිනය දා
පතනෙමු තුටින් දිගාසිරි
6 ශ්‍රේණිය
සිසු දරු දැරියන්
stablediffusionweb.com

අපි දැන් එක් එක් සුබ පැතුම් පත්වල විශේෂතා තව දුරටත් හඳුනා ගනිමු.

- සුබ පැතුම් පත්, විවිධ හැඩතල අනුව කඩදාසි භාවිතයෙන් මෙන් ම පරිගණකය ආශ්‍රයෙන් ද නිර්මාණය කළ හැකි ය.
- වියළි මල් හා පත්‍ර වැනි ස්වාභාවික අමුද්‍රව්‍ය මෙන් ම ඉවත දමන දේ ද යොදා ගත හැකි ය.
- විවිධ උත්සව අවස්ථාවල දී මෙන් ම කෙනෙකුගේ ජයග්‍රහණයක දී ද සතුට ප්‍රකාශ කිරීමට සහ සුබ පැතීමට සුබ පැතුම් පත් යොදා ගත හැකි ය.

**ජයග්‍රහණයක දී සුබ පැතීමට යොදා ගන්නා සුබ පැතුම් පතක් අපි බලමු.**



## අපි දැන් වෙසක් සුබ පැතුම් පතක් බලමු.

සිදුහත් කුමරුගේ උපත, බුදු වීම හා පිරිනිවන් පෑම යන තෙමඟුල සිදු වූ වෙසක් පොහෝ දිනය වෙනුවෙන් සුබ පැතුම් පත් යොදා ගන්නවා.




## අපි දැන් නත්තල් සුබ පැතුම් පතක් බලමු.

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත සිහි කරන නත්තල් උත්සවය වෙනුවෙන් ද සුබ පැතුම් පත් යොදා ගන්නවා. එම දිනය යෙදෙන්නේ දෙසැම්බර් මාසයේ 25 වැනිදාට යි.



## සුබ පැතුම් පතක අන්තර්ගත විය යුතු ලක්ෂණ

- සුබ පැතුම ලබන්නා සහ සුබ පතන්නා සඳහන් කිරීම
- සුබ පැතුම සිදු කරන කාරණය සඳහන් කිරීම
- සරල බස් වහර
- සංක්ෂිප්තභාවය
- නිර්මාණශීලිත්වය
- චිත්‍ර, ඡායාරූප, වර්ණ, විවිධ හැඩතල භාවිත කිරීම
- නිවැරදි ව වචන වෙන් කිරීම
- විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම
- නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිත කිරීම
- ආකර්ෂණීය නිමාවකින් යුක්ත වීම

### ක්‍රියාකාරකම 1.1

1. සුබ පැතුම් පතක ලක්ෂණ හතරක් නම් කරන්න.
2. සුබ පැතුම් පත් භාවිත කරන අවස්ථා හතරක් ඉදිරිපත් කරන්න.

### ක්‍රියාකාරකම 1.2

දැන් අපි සුබ පැතුම් පතක් නිර්මාණය කරමු. එහි දී පහත කරුණු ගැන අවධානය යොමු කරමු.

- පහත සඳහන් අවස්ථාවලින් එකක් තෝරා ගන්න.

උපන් දින උත්සව, ගුරු උපහාර උත්සව, තරග ජයග්‍රහණ අවස්ථා, අලුත් අවුරුදු උත්සව, ආගමික උත්සව

- ඔබ තෝරා ගත් අවස්ථාව සඳහා නිර්මාණශීලී සුබ පැතුම් පතක් සකස් කරන්න.
- සුබ පැතුම් පත සකස් කිරීමේ දී එහි අන්තර්ගත විය යුතු ලක්ෂණ පිළිබඳ සැලකිලිමත් වන්න.
- ඔබ නිර්මාණය කළ සුබ පැතුම් පත් ගුරුතුමාට/ගුරුතුමියට පෙන්වා අදහස් ලබා ගන්න.

## ක්‍රියාකාරකම 1.3

- ඔබේ පන්තියේ මිතුරු මිතුරියන් නිර්මාණය කළ සුබ පැතුම් පත්වලින් ඔබේ සිත් ගත් සුබ පැතුම් පත් කිහිපයක් තෝරා ගන්න.
- ඒවා අගය කරමින් අදහස් දක්වන්න.

**ඔබගේ හැකියාව ඔබ ම අගයන්න.**
**ඔබේ හැකියාවට අදාළ කොටුවේ හරි ලකුණ (✓) යොදන්න.**

| මගේ හැකියාව | ඉතා හොඳයි | හොඳයි | තරමක් හොඳයි |
|---|---|---|---|
| 1. සුබ පැතුම් පතක ලක්ෂණ හතරක් මට ප්‍රකාශ කළ හැකි ය. | | | |
| 2. සුබ පැතුම් පත් භාවිත කරන අවස්ථා හතරක් ප්‍රකාශ කිරීමට මට හැකි ය. | | | |
| 3. සුබ පැතුම් පතක තිබිය යුතු අංග නිවැරදි ව ඇතුළත් කිරීමට මට හැකි ය. | | | |
| 4. නිර්මාණශීලී සුබ පැතුම් පතක් සකස් කිරීමට මට හැකි ය. | | | |
| 5. සුබ පැතුම් පත් නිර්මාණයේ දී නිවැරදි ව භාෂාව භාවිත කිරීමට මට හැකි ය. | | | |

**වැඩිදුර ඉගෙනුම සඳහා**

- ⋆ ඔබේ මිතුරෙකුගේ/මිතුරියකගේ උපන් දිනයට සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.
- ⋆ එය මිතුරාට/මිතුරියට යවන්න.

## ඉගෙනුම් අවස්ථාව 02



කාලච්ඡේද 04යි.

# ආරාධනා පත්‍ර නිර්මාණය කරමු

මෙම ඉගෙනුම් අවස්ථාවේ දී;

- ආරාධනා පත්‍රයක ලක්ෂණ හඳුනා ගැනීමටත්
- විවිධ ආරාධනා පත්‍ර හා ඒවා යොදා ගන්නා අවස්ථා හඳුනා ගැනීමටත්
- නිර්මාණශීලී ව හා නිවැරදි ව ආරාධනා පත්‍රයක් සකස් කිරීමටත්

ඔබට අවස්ථාව ලැබෙනු ඇත.

### පෙර මතකය අවදි කරමු



★ ඔබේ නිවසේ ඇති ආරාධනා පත්‍ර පන්තියට රැගෙන එන්න.

★ මිතුරන් රැගෙන ආ ආරාධනා පත්‍ර හුවමාරු කර ගෙන සංසන්දනය කරන්න.

★ එම ආරාධනා පත්‍රවල වෙනස්කම් හා විශේෂ ලක්ෂණ කියන්න.

ජීවිතයේ විවිධ අවස්ථාවල දී අපට විවිධ වර්ගයේ ආරාධනා පත්‍ර ලැබෙනවා. ඒවායින් කිහිපයක් පහත දක්වා ඇති ආකාරයට හඳුනා ගන්න පුළුවන්.




අධ්‍යාපන ප්‍රදර්ශන



නිල ලාංඡන පැලඳවීමේ උලෙළ




පොත් දොරට වැඩීමේ උත්සව



නව ගොඩනැගිලි විවෘත කිරීම



නිවාසාන්තර ක්‍රීඩා උලෙළ




විවිධ ප්‍රසංග

★ ආරාධනා පත්‍ර විවිධ ස්වරූපයෙන් හා විවිධ ප්‍රමාණයෙන් දැකිය හැකි ය.

★ මේ ආරාධනා පත්‍ර හොඳින් නිරීක්ෂණය කරන්න.

**ආරාධනයයි**

**රන්සිරිපුර මධ්‍ය මහා විද්‍යාලයේ**
**ශිෂ්‍ය නායක නායිකා**
**නිල ලාංඡන පැලඳවීමේ උත්සවය**
**2026 මැයි 02 වන දින**
**පෙ.ව. 08.30 සිට**
**කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ**
**ප්‍රධානත්වයෙන්**
**විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී**
**පැවැත්වේ.**
**ඒ සඳහා ඔබතුමාට/ඔබතුමියට**
**කෙරෙන ගෞරවාන්විත**
**ආරාධනය යි.**

**විදුහල්පති ඇතුළු**
**සංවිධායක කමිටුව**
2026.04.10




ආරාධනා පත්‍රවල ඇතුළත් පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.

**ආරාධනා පත්‍රයක මූලිකාංග**

- ආරාධනා කරන්නේ කුමක් සඳහා ද?
- පැවැත්වෙන දිනය
- වේලාව
- ස්ථානය
- ආරාධනාව ලබන්නේ කවුද?
- ආරාධනා කරන දිනය
- ආරාධනාව සිදු කරන පුද්ගලයා/ආයතනය/සංවිධානය

**ආරාධනා පත්‍රයක විශේෂ ලක්ෂණ**

- නිවැරදි ව වචන වෙන් කිරීම
- නිවැරදි අක්ෂර වින්‍යාසය
- විරාම ලකුණු නිවැරදි ව යෙදීම
- නිර්මාණශීලිත්වය
- සංක්ෂිප්තභාවය
- ආකර්ෂණීය නිමාව

## ක්‍රියාකාරකම 2.1

1. ආරාධනා පත්‍රයක දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ හතරක් කියන්න.
2. එදිනෙදා ජීවිතයේ දී ආරාධනා පත්‍ර භාවිත කෙරෙන අවස්ථා හතරක් නම් කරන්න.
3. ආරාධනා පත්‍රයක ඇතුළත් විය යුතු මූලිකාංග මොනවා ද?

ආරාධනා පත්‍ර සකස් කිරීමේ දී එය ඔබේ කැමැත්ත අනුව නිර්මාණශීලී ලෙස සකස් කළ හැකි ය.

## ක්‍රියාකාරකම 2.2

**දැන් අපි ආරාධනා පත්‍රයක් නිර්මාණය කරමු.**

පහත දැක්වෙන අවස්ථාවලින් එකක් ඒ සඳහා යොදා ගන්න.

- ප්‍රදර්ශනයක්
- කලා උලෙළක්
- ගුරු උපහාර උලෙළක්
- මුල්ගල් තැබීමේ උත්සවයක්
- ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානෝත්සවයක්
- පුස්තකාලයක් විවෘත කිරීමේ උත්සවයක්

ආරාධනා පත්‍රයක් සකස් කිරීමේ දී පහත කරුණු පිළිබඳ සැලකිලිමත් වන්න.

- මූලික තොරතුරු ඇතුළත් කර ආරාධනා පත්‍රයේ කටුසටහනක් ලියා ගන්න. (ආරාධනා කරන කාරණය, පැවැත්වෙන දිනය, වේලාව, ස්ථානය, යවන්නා, ලබන්නා)
- කටු සටහනේ ඇතුළත් තොරතුරු ඔබ තෝරා ගත් කඩදාසියේ ලියන්න.
- වචන සංඛ්‍යාව 35ක් පමණ යොදා ගන්න.
- නිවැරදි ව විරාම ලක්ෂණ භාවිත කරන්න.
- අක්ෂර වින්‍යාසය නිවැරදි ව යොදන්න.
- නිවැරදි ව වචන වෙන් කරන්න.

## ක්‍රියාකාරකම 2.3

1. නිර්මාණය කළ ආරාධනා පත්‍ර ප්‍රදර්ශනය කිරීම සඳහා මිතුරු මිතුරියන් සමග එක් ව පන්ති ප්‍රදර්ශනයක් සැලසුම් කරන්න.
2. ඔබේ සිත් ගත් ආරාධනා පත්‍ර අගය කරමින් අදහස් දක්වන්න.

**ඔබගේ හැකියාව ඔබ ම අගයන්න.**
**ඔබේ හැකියාවට අදාළ කොටුවේ හරි ලකුණ (✓) යොදන්න.**

| මගේ හැකියාව | ඉතා හොඳයි | හොඳයි | තරමක් හොඳයි |
|---|---|---|---|
| 1. ආරාධනා පත්‍රයක තිබිය යුතු ලක්ෂණ හතරක් ප්‍රකාශ කිරීමට මට හැකි ය. | | | |
| 2. ආරාධනා පත්‍ර භාවිත කරන අවස්ථා හතරක් නම් කිරීමට මට හැකි ය. | | | |
| 3. විරාම ලක්ෂණ නිවැරදි ව යොදා ගැනීමට මට හැකි ය. | | | |
| 4. නිවැරදි ව වචන වෙන් කර ලිවීමට මට හැකි ය. | | | |
| 6. අක්ෂර වින්‍යාසය නිවැරදි ව යොදා ගැනීමට මට හැකි ය. | | | |
| 7. ආරාධනා පත්‍රයක් නිර්මාණශීලී ව සකස් කිරීමට මට හැකි ය. | | | |

### වැඩිදුර ඉගෙනුම සඳහා

* පාසලේ පැවැත්වෙන උත්සව අවස්ථාවක් සඳහා සුදුසු ආරාධනා පත්‍රයක් නිර්මාණශීලී ව සකස් කරන්න.
* ඔබ නිර්මාණය කළ ආරාධනා පත්‍රය බිත්ති පුවත් පතේ ප්‍රදර්ශනය කරන්න.

ඉගෙනුම් අවස්ථාව 03



කාලච්ඡේද 04යි.

# සමානාර්ථවත් පද හඳුනා ගනිමු

මෙම ඉගෙනුම් අවස්ථාවේ දී;
- සමානාර්ථවත් පද හඳුනා ගැනීමටත්
- සමානාර්ථවත් පද යොදා හිස්තැන් සම්පූර්ණ කිරීමටත්
- සමානාර්ථවත් පද යොදා ගනිමින් වාක්‍ය නිර්මාණය කර ලිවීමටත් ඔබට හැකියාව ලැබෙනු ඇත.

## පෙර මතකය අවදි කරමු



නෙලුම් මලේ හිස් තැනට ගැළපෙන පෙත්ත තෝරන්න.




★ නෙලුම් මලට විවිධ නම් යෙදෙනවා.
★ ඒවා සමානාර්ථවත් පද ලෙස ඔබ හඳුනා ගත්තා ද?
★ පහත වචනවලට යෙදෙන සමානාර්ථවත් පද ඔබ දන්නවා දැයි බලන්න.

- අහස -
- සඳ -
- මුහුද -
- අම්මා -

## ක්‍රියාකාරකම් 3.1

පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් දක්වා ඇති පද සඳහා සුදුසු සමානාර්ථ දෙන පද, කොටුවෙන් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

| |
|---|
| ප්‍රකට, අම්ල, කොඩිය, ග්‍රන්ථ, කඳු, දියුණුව, රැක ගැනීම, උදවු, ලියුම, විදුහල, අලුත්වැඩියා, යහළුවන්, පද්‍ය, වතුර, මාර්ගය |

1. අපි **ජලය**/.................... අපතේ නො හැර ප්‍රයෝජනයට ගැනීමට ඉගෙන ගනිමු.
2. හොඳ **මිතුරන්**/................. ලබා දෙන උපදෙස් ජීවිතයට ප්‍රයෝජනවත් වේ.
3. අපි **පාර**/.................... දෙපස ගස් සිටුවා පරිසරය අලංකාර කිරීමට උත්සාහ කරමු.
4. මම **කාව්‍ය**/.................... නිර්මාණ කියවා රස විඳිමින් අදහස් ප්‍රකාශ කිරීමට නිතර උත්සාහ ගනිමි.
5. අපේ **පාසල**/.................... පිරිසිදු ව තබා ගැනීමට අප උනන්දු වී කටයුතු කළ යුතු ය.
6. මම මිතුරා එවූ **ලිපිය**/.................... කියවා සතුටු වීමි.
7. මම සැම අවස්ථාවක ම මිතුරු මිතුරියන්ට **උපකාර**/.................... කිරීමට උත්සාහ කරමි.
8. ශ්‍රී ලංකාව ස්වාභාවික සම්පත් බහුල රටක් ලෙස **ප්‍රසිද්ධ**/.................... වී ඇත.
9. පොදු දේපළ **සුරැකීම**/.................... අපේ වගකීමකි.
10. මවුබිම **අගනා**/....................සම්පතක් සේ සිතා කටයුතු කිරීම අපේ වගකීම යි.
11. මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ **පොත්**/.................... විවිධ භාෂාවලට පරිවර්තනය වී ඇත.
12. නිදහස් දින උත්සවයේ දී ජාතික **ධජය**/.................... එසවීම සම්ප්‍රදායකි.
13. බොහෝ ගංගා **ගිරි**/.................... මුදුනින් ආරම්භ වෙතැයි පිළිගැනේ.
14. රටේ **ප්‍රගතිය**/.................... උදෙසා සියලු ම පුරවැසියන්ගේ අවංක දායකත්වය අවශ්‍ය වේ.
15. අපි වැව් **ප්‍රතිසංස්කරණය**/.................... කර ගොවිතැනට ජලය ලබා ගනිමු.

### ක්‍රියාකාරකම් 3.2

- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් වන්න.
- ගුරුතුමා/ගුරුතුමිය ලබා දෙන වචන මංජුසාවෙන් වචනයක් තෝරා ගෙන එම වචනයට සමාන අර්ථයක් සහිත වචනය තේරීමේ ක්‍රීඩාවේ නිරත වන්න.

පහත දැක්වෙන ඡේදය කියවා ඒ ඇසුරෙන් දී ඇති ක්‍රියාකාරකමෙහි නිරත වන්න.

## ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතා



මෙරට ජීවත් වූ විද්වතුන් අතර විශේෂ පුද්ගලයකු ලෙස ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතා හඳුන්වා දිය හැකි ය. 1905 මාර්තු මස පස් වැනි දින මෙතුමා උපත ලැබී ය. පියා සරනේලිස් නම් විය. මව සිසිලියානා නම් වූවා ය. අදිකාරම් මහතා දෙහිවල ශාන්ත මරියා විද්‍යාලයෙන් අධ්‍යාපනයට පිවිසුණේ ය. ඔහු කුඩා කාලයේ දී ම තම පියා අහිමි වීම නිසා මවත් සමග ඇගේ ගම වූ වැල්ලම්පිටිය ප්‍රදේශයට ගොස් ඉතා දුෂ්කර ජීවිතයක් ගත කර ඇත. පසුව මෙතුමාට විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට හැකි විය. ඉගෙනීමේ කටයුතුවලට අවශ්‍ය මිල මුදල් නොතිබුණ ද මෙතුමා උත්සාහය අත හැරියේ නැත.

ජීවිතයට පැමිණි අභියෝග හමුවේ නොසැලී කටයුතු කළ අදිකාරම් මහතා ආචාර්ය උපාධිය ද දිනා ගැනීමට සමත් විය.

කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේ විදුහල්පති ධුරයට පත් වූ අදිකාරම් මහතා එම විද්‍යාලයේ දියුණුවට විශාල සේවයක් ඉටු කළේ ය. නුගේගොඩ අනුලා විද්‍යාලය, මහරගම විද්‍යාකර විද්‍යාලය, මතුගම ආනන්ද ශාස්ත්‍රාලය, පැපිලියානේ මහාමායා විද්‍යාලය ආදි බෞද්ධ විද්‍යාල රැසක් ආරම්භ කිරීම සඳහා ද මෙතුමා මූලිකත්වය ගෙන කටයුතු කළේ ය. මෙරට පාසල්වලට නිදහස් අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දීමේ දී සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නංගර මහතා සමග අදිකාරම් මහතා ද විශාල වැඩ කොටසක් ඉටු කර ඇත. එතෙක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම් කළ විද්‍යා විෂයන් සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම පිණිස කටයුතු සූදානම් කළේ ය. 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා විද්‍යා පොත් පෙළක් මෙතුමා අතින් රචනා විය.

### ක්‍රියාකාරකම 3.3

පහත දැක්වෙන එක් එක් පදවලට සමානාර්ථ දෙන පද ඡේදයෙන් තෝරා ලියමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | උගතුන් | - | 2. | තාත්තා | - |
| 3. | විදුහලෙන් | - | 4. | තනතුරට | - |
| 5. | ඉගෙනුමට | - | 6. | මහත් | - |
| 7. | අපහසු | - | 8. | ජය ගැනීමට | - |
| 9. | උවමනා | - | 10. | බාධක | - |
| 11. | ග්‍රන්ථ | - | 12. | පොඩි | - |
| 13. | දිවියට | - | 14. | ප්‍රධානත්වය | - |
| 15. | අම්මා | - | | | |

### ක්‍රියාකාරකම 3.4

1. පහත කොටුවේ ලබා දී ඇති පද සඳහා සමානාර්ථවත් පද ලියන්න.
2. එම පද නිවැරදි ව භාවිත කරමින් අර්ථවත් වාක්‍ය 15ක් නිර්මාණය කරන්න.
3. ඔබ නිර්මාණය කළ වාක්‍ය 15 අභ්‍යාස පොතේ සටහන් කර ගන්න.
4. ඔබ නිර්මාණය කළ වාක්‍ය ගැන ගුරුතුමා/ගුරුතුමිය සමග සාකච්ඡා කරන්න.

ආලෝකය, ගස, පක්ෂියා, හිරු, අහස, ඉලක්කම්, පුෂ්පය, සොම්නස, අම්මා, ශරීරය, ඇස, කාන්තාව, කෙත, චන්ද්‍රයා, සාගරය

**ඔබගේ හැකියාව ඔබ ම අගයන්න.**
**ඔබේ හැකියාවට අදාළ කොටුවේ හරි ලකුණ (✓) යොදන්න.**

| මගේ හැකියාව | ඉතා හොඳයි | හොඳයි | තරමක් හොඳයි. |
|---|---|---|---|
| 1. ඡේදය කියවා සමානාර්ථවත් පද 15ක් හඳුනා ගන්න මට පුළුවන් | | | |
| 2. වචන 15ක් සඳහා සමානාර්ථවත් පද ලියන්න මට පුළුවන් | | | |
| 3. සමානාර්ථවත් පද යොදා නිවැරදි වාක්‍ය 15ක් ලියන්න මට පුළුවන් | | | |

## උගත් දේ සිහි කරමු

- සුබ පැතුම් පතක ලක්ෂණ හඳුනා ගැනීමටත්
- සුබ පැතුම් පත් භාවිත වන අවස්ථා හඳුනා ගෙන ප්‍රකාශ කිරීමටත්
- නිර්මාණශීලී ව සුබ පැතුම් පතක් සකස් කිරීමටත්
- ආරාධනා පත්‍රයක ලක්ෂණ හඳුනා ගැනීමටත්
- ආරාධනා පත්‍ර භාවිත වන අවස්ථා හඳුනා ගෙන ප්‍රකාශ කිරීමටත්
- නිර්මාණශීලී ව ආරාධනා පත්‍ර සකස් කිරීමටත්
- දෙන ලද ඡේදය ඇසුරෙන් සමානාර්ථවත් පද හඳුනා ගැනීමටත්
- දෙන ලද පද වෙනුවට සුදුසු සමානාර්ථවත් පද යොදා වාක්‍ය සම්පූර්ණ කිරීමටත්
- දෙන ලද පද සඳහා සමානාර්ථවත් පද යොදා වාක්‍ය නිර්මාණය කර ලිවීමටත්

මෙම මොඩියුලය හැදෑරීමෙන් ඔබට හැකියාව ලැබෙන්නට ඇත.

## අර්ථය හඳුනා ගනිමු

| | |
|---|---|
| අක්ෂර වින්‍යාසය | අකුරු නිවැරදි ව යෙදීම |
| අවස්ථෝචිත | අවස්ථාවට ගැළපෙන/උචිත |
| ත්‍යාග ප්‍රදානය | තෑගි දීම |
| නිල ලාංඡන | නිලයට අදාළ සංකේතය |
| ශාස්ත්‍රාලය | අධ්‍යාපන ආයතනය/පාසල |

## පළමු වාරය - මොඩියුල අංක 03

# සාහිත මිහිර - 01



කාලච්ඡේද 04යි.

## ඉගෙනුම් අවස්ථාව 01

# කතන්දර කියවමු - ගුණ නුවණ වඩවමු

මෙම ඉගෙනුම් අවස්ථාවේ දී;

- ජනකතා යනු මොනවා දැයි හඳුනා ගැනීමටත්
- ජනකතාවල ඇතුළත් අලුත් වචන හඳුනා ගැනීමටත්
- ජනකතා රස විඳීමටත්

ඔබට හැකියාව ලැබෙනු ඇත.

පුලුන් රොදක් වගේ වෙන්න
සතුටු සිතින් දිවි ගෙවන්න
ගුණ නුවණින් ලොව දිනන්න
කතන්දරය රස විඳින්න

### පෙර මතකය අවදි කරමු



පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු කියන්න.

1. ඔබ මින් පෙර පාසලේ දී ඉගෙන ගත් කතන්දරයක නම කියන්න.
2. එම කතන්දරයේ ඇතුළත් චරිත දෙකක් කියන්න.
3. එම කතන්දරයෙන් ඔබේ ජීවිතයට ලැබුණු ආදර්ශය/ආදර්ශ සඳහන් කරන්න.

පහත සඳහන් ඡේදය නිශ්ශබ්ද ව කියවන්න.
ජනකතා පිළිබඳ ගුරුතුමා/ගුරුතුමිය සමග සාකච්ඡා කරන්න.

## ජනකතා හඳුනා ගනිමු

අතීතයේ ජීවත් වූ මිනිසුන් ඔවුන්ගේ දැනුම හා අද්දැකීම් පරපුරෙන් පරපුරට දායාද කළේ කටින් කට එම තොරතුරු ගෙන යාමෙනි. එම තොරතුරු වර්තමානයේ දී අප හඳුන්වන්නේ ජනශ්‍රැති (Folklore) ලෙස යි. අප වර්තමානයේ අසන, කියවන ජනකතා, පිරුළු, ජනකවි, ජනනාටක ආදිය ජනශ්‍රැතියට අයත් වෙයි.

මෙම ජනශ්‍රැති මගින් අපට අතීත ජනතාවගේ සිරිත්-විරිත්, ගති-පැවතුම්, ඇදහිලි-විශ්වාස ගැන වගේ ම කතා බහ කරන ආකාරය ගැනත් ඉගෙන ගත හැකි ය. ලෝකයේ සෑම රටක ම ජනතාව අතර ජනකතා දක්නට ලැබෙයි. පැරණි ජනයා ව්‍යවහාර කළ භාෂාව හා වර්තමානයේ අප භාවිත කරන භාෂාව අතර යම් යම් වෙනස්කම් ඇත. මුද්‍රණ ශිල්පයේ දියුණුව සමග කටවහරින් පැවත ගෙන එන ජනශ්‍රැති ලේඛනගත කර මුද්‍රණය කිරීමට විවිධ ලේඛකයන් උත්සාහ ගෙන තිබේ. ඒ. පී. ගුණරත්න මහතා එවැනි ලේඛකයෙකි.




අපි දැන් රස විඳීමට සූදානම් වන්නේ ඒ. පී. ගුණරත්න මහතාගේ 'නගුල් මුන්නා සහ තවත් කතා' පොතේ එන ජනකතාවකි.

අපි කතන්දරය කියවමු; කතාවේ සිදුවීම් චිත්ත රූපවලට නගා ගැනීමට උත්සාහ ගනිමු.

## පුලුන් රොද

එකමත් එක නුවරක අක්කා නගෝ දෙන්නෙක් හිටියා. මේ දෙන්නට ම ගෑනු දරුවො දෙන්නෙකුත් හිටියා. එක දවසක් මේ නගා එළියෙ ඉඳගෙන කපු කැට කැට ඉන්න කොට ඇගේ පොඩි දුවත් එතෙන්ට ඇවිත් පුලුන් සුද්ද කරන්ට පටන් ගත්තා. මේ ළමයා පුලුන් සුද්ද කර කර ඉන්න කොට ලොකු හුළඟක් ඇවිදින් ළමයා අතේ තුබුණ ලොකු කපු පුලුන් රොදක් හුළඟට ගහගෙන ගියා. ඉතින් ඒ වැරැද්දට ළමයගෙ අම්මා ළමයාට තළලා කීවා ගිහින් තියෙන තැනකින් පුලුන් ටික හොයා ගෙන මිස නැත්නම් ගෙදර එන්ට එපා කියලා. අනේ, මේ ළමයාත් අඬ අඬා කපු පුලුන් ටික හුළඟෙ ගිය අතට යන්ට ගියා.



ඒ යන කොට ළිඳක් ළඟ හොඳට ම මැලි ගෑනියක් මේ ළමයට කතා කර කීවා "අනේ දුවේ දෙතුන් දොහකින් නාගන්ට බැරි වුණා. මට මේකෙන් දිය ගන්ට බැහැ. දිය ටිකක් ඇදල වක්කරලා පලයන්" කියලා.

ළමයාත් නැවතිලා ඒ මැලි ගෑනි නාවලා යන්ට ගියා. යන කොට මැලි ගෑනි කීවා "අනේ උඹට හොඳක් ම වෙයි දුවේ" කියලා.

ඉතින් මේ ළමයා ඔහොම යන කොට තද අව්ව තියන තැනක බැඳලා උන්න එළදෙනෙක් ළමයට කතා කරලා කීවා "අනේ දුවේ මාව අර හෙවණෙන් බැඳලා පලයන්" කියලා.



ළමයා නැවතිලා එළදෙන හෙවණෙන් බැඳලා යන්ට ගියා. යන කොට එළදෙන කීවා "අනේ උඹට හොඳක් ම වෙයි දුවේ" කියලා.

ඒ කාරියත් කරලා ළමයා ආයෙත් යන කොට දුටුවා අර පුලුන් රොද වේ රැනක පැටලිලා ඉහළ තියෙනවා. ඉතින් ඒක ගන්ට කෙක්කක් බඳින කොට රජ්ජුරුවො එතනින් යන්ට ආවා. රජ්ජුරුවො ළමයා දැකලා මොකද කරන්නෙ කියලා අහලා ළමයට කීවා, "හොඳයි මම ඔය පුලුන් ටික අරගෙන එන්නම්. උඹ මගෙ මාලිගාවට ගිහින් බත් ටික උයා දෙනවා නම්" කියලා.

ඉතින් මේ ළමයාත් බෑ නොකියා ගිහින් බත් උයන්ට පටන් ගත්තා. ගෙදර දොරේ වැඩ කරලා පුරුදු ඇති ළමයා නිසා බතුත් මාලුත් හොඳට ඉව්වා.



ඊට පස්සෙ රජ්ජුරුවො පුලුන් ටිකත් ඇරගෙන මාලිගාවට ගිහින් "හොඳයි එහෙනං අපි බත් කමු" කියලා රජ්ජුරුවො බත් කාලා ළමයාටත් කන්ට දීලා ළමයා මාලිගාව ඇතුළට අඬගහගෙන ගිහින් ලොකු පුංචි පෙට්ටි ගොඩක් පෙන්නා කීවා "මෙන්න මේ පෙට්ටිවලින් කැමති පෙට්ටියක් තෝරලා ඇරගෙන යන්ට" කියලා.

ඉතින් ළමයත් පෙට්ටි දිහා ටිකක් වෙලා බලා ගෙන ඉඳලා හඳුන් ලීයෙන් හදපු කුඩා පෙට්ටියක් තෝරලා අතට ගත්තා.

ඒ ගමන් රජ්ජුරුවො කීවා "බොහොම හොඳා. උඹටත් උඹෙ අම්මා අප්පාටත් මේ ජීවිතේට ඇති තරම් දේ ඔය පෙට්ටියෙ තියෙනවා. හොඳයි ඇරගෙන ගෙදර පලයන්" කියලා.

ළමයා පුලුන් ටිකත් පුංචි හඳුන් පෙට්ටියත් ඇරගෙන ගෙදර ගිහින් සිද්ද වෙච්ච ඔක්කොම දේ අම්මාටත් තාත්තාටත් කියලා පෙට්ටිය ඇරියා බලන්ට. පෙට්ටියෙ තිබුණා වටිනා මැණික් ගල් කීපයක්.

මේ කතාව දැන ගන්ට ලැබිලා අක්කයි අක්කගෙ දුවයි දෙන්නත් ඇවිදින් වගතුග ඇහුවා. එතකොට නංගිගෙ දුව අතින් පුලුන් රොද හුළඟට ගිය තැන හිටන් ඔක්කොම විස්තරේ කීවා.

ඊට පස්සෙ අක්කාටත් මේ වගේ වස්තුවක් ලබා ගන්නට ආසාවෙන් පහුව දා එයත් දුවගෙ අතින් පුලුන් ටිකක් හුළඟෙ යන්නට ඇරියා. මේ පුලුන් රොදත් අර වගේ ම හුළඟට ගහගෙන ගියා. ඒ ගමන අක්කා ඒ ගැන බැණ වැදිලා දුවට තළලා ඈ පිටත් කළා පුලුන් රොද ඇරගෙන ම මිස ගෙදර හරියට එන්ට එපා කියලා.

ඒ ළමයාත් අර වගේ ම අඬ අඬා යන කොට ළිඳක් ළඟ මැලි අම්මා කෙනෙක් ඉඳලා කීවා "අනේ දුවේ මට දිය ටිකක් ඇදලා වක්කරලා පලයන්කො" කියලා. එහෙම කියාපුවාම මේ ළමයාට තරහ ගිහින් "ඉඳකින් උන්දැගෙ හැටි!" කියලා යන්ට ගියා. ඒ යන කොට අව්වෙ බැඳපු එක එළදෙනෙක් හිටියා. ළමයා එන කොට එළදෙන ළමයට කතා කරලා කීවා "අනේ දුවේ මා අර හෙවණෙන් බැඳලා පලයන්කො" කියලා.

ඉතින් මේ ළමයා"මට බෑ" කියලා එතනින් යන්ට ගියා. ඔහොම යන කොට ඔන්න එක තැනකදි දුටුවා අර පුළුන් රොද වේ රූනක පැටලිලා තියෙන වග. මේ ළමයා ඒක ගන්ට කෙක්කක් බඳින කොට ඔතනින් යන්ට ආවා රජ්ජුරුවො.

"උඹ ඔය මොකද කරන්නෙ" කියලා අහලා රජ්ජුරුවො කීවා "හොඳයි මම පුලුන් ටික ඇරගෙන එන්නම්. උඹ අර මාලිගාවට ගිහින් මගෙ බත් ටික උයා දියන්" කියලා.

මේ ළමයාත් ගිහින් බතුත් මාලුත් ඉවුවා. රජ්ජුරුවො ඇවිත් "හා එහෙනං බත් කමු" කියලා කන්ට ගියාට කෑම කිසි රහකට උයලා තිබුණෙ නෑ. දිය රහයි. ඊට පස්සෙ රජ්ජුරුවො ඈ මාලිගාව ඇතුළට අඬගහගෙන ගිහින් පෙට්ටි හුඟක් පෙන්නා කීවා "මෙන්න මේ පෙට්ටිවලින් කැමති පෙට්ටියක් තෝරලා ඇරගෙන යන්ට" කියලා.

ළමයත් පෙට්ටි දිහා බලලා හොඳ ලොකු ඒවායින් පෙට්ටියක් තෝරා ගත්තා. රජ්ජුරුවො කීවා "හොඳයි එහෙනම් ඇරගෙන පලයන්. එළියක පහළියක දි හෙම පෙට්ටිය අරින්ට එපා" කියලා.

ළමයා පුලුන් ටිකත් අත ඇරලා පෙට්ටිය විතරක් කර ගහගෙන ගෙදර ආවා. ගෙදර ඇවිත් ගේ ඇතුළට ම ඇරගෙන ඔක්කොම එක්ක වටවෙලා පෙට්ටිය ඇරලා බැලින්නම් ඒකේ හිටියෙ ඔක්කොම සරපයි.



නයි පොළොංගු ඒ පාර ඔක්කොම කෑ ගාගෙන දුවන්ට උණා. සරපයො ගේ පුරා ගිහින් ගෙයි තැන් තැන්වල හැංගුණා. අන්තිමට සරපයින් නිසා උන්න ගේත් අත ඇරලා යන්ට සිද්ද උණා.

**වැඩිදුර ඉගෙනුම සඳහා**

ජනකතාවට සවන් දීම සඳහා QR කේතය යොදා ගන්න.

Channel NIE

## කතුවරයා හඳුනා ගනිමු

### ඒ. පී. ගුණරත්න



ඒ. පී. ගුණරත්න මහතාගේ කෘති

බැද්දේගම (පරිවර්තන)
වනසරණ (පරිවර්තන)
මැකී ගිය දඩමං (පරිවර්තන)
වටු කිරිල්ලී සහ තවත් කතා
සුදු ගෝනා (පරිවර්තන)
රන් කැකිර හා තවත් කතා
සිංහල කටන්දර

ජනකතා කියවීමෙන් අපට ඉතා අගනා උපදෙස් වගේ ම අපේ ජන සංස්කෘතිය හා බැඳුණු භාෂා යෙදුම් ඉගෙන ගැනීමට හැකි ය. 'පුලුන් රොද' ජනකතාවෙත් එවැනි භාෂා යෙදුම් ඇති බව පුංචි ඔබ හඳුනා ගත්තා නේ ද? මෙම ජනකතාව වඩාත් රසවත් වෙන්නත් ඒ වචන හේතු වෙනවා. එවැනි භාෂා යෙදුම් කීපයක් අපි නැවතත් මේ ජනකතාව කියවමින් සොයමු.

### ක්‍රියාකාරකම 1.1

- 'පුලුන් රොද' ජනකතාව ඇසුරෙන් අසා ඇති පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

  1. 'පුලුන් රොද' ජනකතාවේ ඇතුළත් වූ චරිත හතරක් නම් කරන්න.

2. අක්කාගේ දරුවා ප්‍රමාණයෙන් විශාල පෙට්ටියක් තෝරා ගැනීමට හේතුව කුමක් විය හැකි ද?
3. ජනකතාවෙන් උපුටා ගත්, පහත දී ඇති තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථය සරල බසින් ලියන්න.
   i. "ඉතින් ඒ වැරැද්දට ළමයගෙ අම්මා ළමයාට **තළලා** කීවා ගිහින් තියෙන තැනකින් පුලුන් ටික හොයා ගෙන මිස නැත්නම් ගෙදර එන්ට එපා කියලා."
   ii. "අනේ දුවේ මට **දිය** ටිකක් ඇදලා වක්කරලා පලයන්කො"
   iii. "අර පුලුන් රොද **වේ රෑනක** පැටලිලා තියෙන වග"
   iv. "ගෙදර දොරේ වැඩ කරලා පුරුදු ඇති ළමයා නිසා **බතුත් මාලුත්** හොඳට ඉවුවා."
   v. 'මේ කතාව දැනගන්ට ලැබිලා අක්කයි අක්කගෙ දුවයි දෙන්නත් ඇවිදින් **වගතුග** ඇහුවා.'

★ මෙම වචන/යෙදුම්වල අදහස අභ්‍යාස පොතේ ලියන්න.

**ක්‍රියාකාරකම 1.2**

1. මෙම ජනකතාව රසවත් වීමට හේතු වූ කරුණු දෙකක් ඉදිරිපත් කරන්න.
2. මේ ජනකතාවෙන් ඔබේ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ මොනවා ද?

**ක්‍රියාකාරකම 1.3**

පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් වන්න.

1. කණ්ඩායමේ සිසුන් අතර සාකච්ඡා කර 'පුලුන් රොද' ජනකතාවේ අවසානය නිර්මාණශීලී ව වෙනස් කර කතාව නැවත ලියන්න.
2. ඔබගේ කණ්ඩායම විසින් නිර්මාණය කරන ලද කතාව පන්තියට ඉදිරිපත් කරන්න.
3. අනෙක් කණ්ඩායම් ඉදිරිපත් කළ කතා අගය කරමින් අදහස් දක්වන්න.

ලිවීමේ ක්‍රියාකාරකම්වල දී පහත සඳහන් කරුණු ගැන අවධානය යොමු කරන්න.

- නිවැරදි අක්ෂර වින්‍යාසය
- විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම
- නිවැරදි ව වචන වෙන් කිරීම

**ඔබගේ හැකියාව ඔබ ම අගයන්න.**
**ඔබේ හැකියාවට අදාළ කොටුවේ හරි ලකුණ (✓) යොදන්න.**

| මගේ හැකියාව | ඉතා හොඳයි | හොඳයි | තරමක් හොඳයි |
|---|---|---|---|
| 1. 'පුලුන් රොද' ජනකතාවේ එන ජන ව්‍යවහාරයේ භාෂා යෙදුම් පහක් කියන්න මට පුළුවන් | | | |
| 2. එම ජන ව්‍යවහාරයේ පවතින යෙදුම් පහක් සඳහා පොදු ව්‍යවහාරයේ පවතින යෙදුම් පහක් කියන්න මට පුළුවන් | | | |
| 3. 'පුලුන් රොද' ජනකතාව ඇසුරෙන් අසන ප්‍රශ්න තුනකට පිළිතුරු දෙන්න මට පුළුවන් | | | |

## වැඩිදුර ඉගෙනුම සඳහා

★ තවත් ජනකතා පොත් සොයා ගෙන කියවන්න.

★ ඔබේ වැඩිහිටියන් දන්නා ජනකතා අසා රස විඳින්න.

## ඉගෙනුම් අවස්ථාව 02



කාලච්ඡේද 04යි.

# කවි මිහිර විඳිමු

## ළමයා සහ ගොළුබෙල්ලා

මෙම ඉගෙනුම් අවස්ථාවේ දී

- 'ළමයා සහ ගොළුබෙල්ලා' කවි පන්තිය නිර්මාණය කළ කතුවරයාගේ ජීවන තොරතුරු හඳුනා ගැනීමටත්
- කවි පන්තිය කියවා අර්ථය අවබෝධ කර ගැනීමටත්
- කවි පන්තියේ රසය විඳ ගැනීමටත්

ඔබට හැකියාව ලැබෙනු ඇත.

### පෙර මතකය අවදි කරමු



පහත සඳහන් ප්‍රශ්නවලට උත්තර කියන්න.

1. පාසලේ දී ඔබ ඉගෙන ගත් කවි පන්තියක් නම් කරන්න.
2. එම කවි පන්තියේ රචකයා කවුද?
3. ඔබ දන්නා කවියක් මතකයෙන් කියන්න.

## සොයා යමු කිවිඳුන් - කවි රස නිති බෙදා දුන්

### රත්න ශ්‍රී විජේසිංහ



වෙනත් නිර්මාණ -
සින්දු කියන උණ පඳුර,
රන්කිරිකට, රතු කිකිළි,
සුබ උදෑසන, පැණි කුරුල්ලා,
ළහිරු මඬල

සම්මාන - මධ්‍යම යාමය - ගොඩගේ සම්මානය (2025)
සුබ උදෑසන - රාජ්‍ය සම්මානය (1998)




- ‘ළමයා සහ ගොළුබෙල්ලා’ කවි පන්තිය අන්තර්ගත වන්නේ ‘සැලළිහිණියෝ’ ළමා ගී පොතේ.

**ක්‍රියාකාරකම 2.1**

‘ළමයා සහ ගොළුබෙල්ලා’ පද්‍ය පන්තිය පිළිබඳ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ‘ළමයා සහ ගොළුබෙල්ලා’ පද්‍ය නිර්මාණයේ කතුවරයා කවුද?
2. එම කතුවරයාගේ වෙනත් නිර්මාණ දෙකක් නම් කරන්න.

## ළමයා සහ ගොළුබෙල්ලා

ළමයා - ගොළුබෙල්ලෝ ගොළුබෙල්ලෝ ඔහොම ගියාට
පුළුවනිදෝ ගහ මුදුනට යන්න ඔයාට

ගොළුබෙල්ලා - උසට උසේ ගහ හැදුණේ නෑ එක රෑට
ඇයි ළමයෝ තේරෙන්නේ නැද්ද ඔයාට

ළමයා - ගහ මුදුනේ කොළ විතරයි මල් නෑ පාට
වෙහෙස වෙලා මොකටද ලස්සන නැති දේට

ගොළුබෙල්ලා - එක රැයකින් ලස්සන හිමි වෙනවද කාට
දළඹු වෙසක් තිබුණ නේද සමනලයාට

ළමයා - හිමින් හිමින් ගාට ගාට ඔහොම ගියාට
හිස් අතින් ම බිමට එන්න වේවි ඔයාට

ගොළුබෙල්ලා - හිමින් හිමින් ගහ මුදුනට මං යන දාට
ගහ මුදුනේ මල් පිපේවි ලස්සන පාට

## ක්‍රියාකාරකම 2.2

1. පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් වන්න.
1. 'ළමයා සහ ගොළුබෙල්ලා' කවි පන්තිය කණ්ඩායම එකතු වී කියවන්න.
2. කවියේ අර්ථය ඔබේ ගුරුතුමා/ගුරුතුමිය සමග සාකච්ඡා කරන්න.
3. මෙම කවි පන්ති රසවත් වීමට හේතු වූ කරුණු දෙකක් ගැන කණ්ඩායමේ සිසුන් සාකච්ඡා කර පන්තියට ඉදිරිපත් කරන්න.
4. අනෙක් කණ්ඩායම් ඉදිරිපත් කරන අදහස්වලට සවන් දෙන්න.
5. කවිය රසවත් වීමට හේතු වූ කරුණු දෙකක් විස්තර සහිත ව ඔබේ සටහන් පොතේ ලියා ගන්න.

## ක්‍රියාකාරකම 2.3

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්න.

1. "ළමයා සහ ගොළුබෙල්ලා" පද්‍ය නිර්මාණයෙන් කියවෙන්නේ කුමක් පිළිබඳ ව ද?
2. මෙම කවියේ සංවාදය සිදු වන්නේ කවුරුන් අතර ද?
3 මෙම කවි පදවල අදහස ඔබේ වචනයෙන් ලියන්න.

"දළඹු වෙසක් තිබුණ නේද සමනලයාට"
"හිස් අතින් ම බිමට එන්න වේවි ඔයාට"
"උසට උසේ ගහ හැදුණේ නෑ එක රැට"
"වෙහෙස වෙලා මොකටද ලස්සන නැති දේට"

4. කවි පන්තියෙන් ඔබේ ජීවිතයට ලබා ගත් ආදර්ශයක් ඉදිරිපත් කරන්න.

## කවි පෙළේ විශේෂතා හඳුනා ගනිමු.



මේ කවි පෙළෙ ලියා තිබෙන්නේ ළමයෙකු හා 'ගොළුබෙල්ලෙකු අතර කතා බහක්' (සංවාදයක්) ලෙස යි.

උදාහරණය :-
ළමයා -

'ගොළුබෙල්ලෝ ගොළුබෙල්ලෝ ඔහොම ගියාට'
'පුළුවනිදෝ ගහ මුදුනට යන්න ඔයාට'

කවි පෙළ අසා සිටින විට අපට ඒ දෙදෙනා කතා කරන බවක් තේරෙනවා. පුංචි අපට තේරුම් ගත හැකි සරල හා රසවත් බසින් මෙම කවි පෙළ ලියා තිබෙනවා. ඒ වගේ ම තාලයකට ගායනා කළ හැකි විදියට මේ කවි ලියා තිබෙනවා.

උදාහරණය :-
'උසට උසේ ගහ හැදුණේ නෑ එක රෑට'
'දළඹු වෙසක් තිබුණා නේද සමනලයාට'

නොපසුබට උත්සහයෙන් ජීවිතය ජය ගත හැකි ආකාරය ගැන අපූරු ආදර්ශයක් මෙම කවි පෙළෙන් අපට ලැබෙනවා. සත්ත්ව ලෝකය ගැනත් ගස් වැල් ගැනත් අලුතෙන් සිතා බලන්න අපට මේ කවි පෙළ මග පෙන්වනවා.

## ඔබගේ හැකියාව ඔබ ම අගයන්න.
## ඔබේ හැකියාවට අදාළ කොටුවේ හරි ලකුණ (✓) යොදන්න.

| මගේ හැකියාව |  |  |  |
|---|---|---|---|
| 1. 'ළමයා සහ ගොළුබෙල්ලා' කවි පන්තිය ලියූ රචකයාගේ නම කියන්න මට පුළුවන් | | | |
| 2. එම රචකයා ලියා ඇති වෙනත් පොත් දෙකක නම් කියන්න මට පුළුවන් | | | |
| 3. 'ළමයා සහ ගොළුබෙල්ලා' කවි පන්තියේ ප්‍රධාන අදහස කියන්න මට පුළුවන් | | | |
| 4. කවි පන්තියේ චරිත නම් කරන්න මට පුළුවන් | | | |
| 5. කවියේ අර්ථය සරල බසින් කියන්න මට පුළුවන් | | | |
| 6. කවිය රසවත් වීමට හේතු වූ කරුණු දෙකක් කියන්න මට පුළුවන් | | | |
| 8. කවි පන්තියෙන් ලැබෙන ආදර්ශ කියන්න මට පුළුවන් | | | |

### වැඩිදුර ඉගෙනුම සඳහා

- ★ 'ළමයා සහ ගොළුබෙල්ලා' කවි පෙළේ ගායනය අන්තර්ජාලයෙන් සොයා ගෙන රස විඳින්න.
- ★ මෙම පද්‍ය පන්තිය ලියූ කතුවරයාගේ වෙනත් කාව්‍ය/ගීත නිර්මාණ සොයා ගෙන කියවන්න.

## ඉගෙනුම් අවස්ථාව 03

# ගී මිහිර විඳිමු



කාලච්ඡේද 03යි.

## කටු අකුලේ මල් ඇහැරේ

මෙම ඉගෙනුම් අවස්ථාවේ දී;

- 'කටු අකුලේ මල් ඇහැරේ' ගීතයේ කතුවරයාගේ ජීවන තොරතුරු හඳුනා ගැනීමටත්
- එම සාහිත්‍ය නිර්මාණය කියවා අර්ථාවබෝධ කර ගැනීමටත්
- ගීතය රසය විඳීමටත්

ඔබට හැකියාව ලැබෙනු ඇත.

### පෙර මතකය අවදි කරමු



පැනයට නිසි පිළිතුරු දෙමු.

- ඔබ අසා ඇති ළමා ගීතයක් නම් කරන්න.
- එම ගීතයෙන් කියවෙන අදහස ඉදිරිපත් කරන්න.

**අන්තර්ජාලයට පිවිස 'කටු අකුලේ මල් ඇහැරේ' ගීතයට සවන් දෙන්න.**

'කටු අකුලේ මල් ඇහැරේ'

- 'අඹ යහළුවෝ' ටෙලි නාට්‍යයේ තේමා ගීතය



ගායනය
එඩ්වඩ් ජයකොඩි



රචනය
බන්දුල නානායක්කාරවසම්



සංගීතය
ආනන්ද ගමගේ

රචකයාගේ වෙනත් ගීත නිර්මාණ

- රන් හිරු මඬලින්
- ඉර ලස්සනයි
- රෑ වැඩ මුරය
- සුදු ඇත් පොව්වෙක්
- ගඟක් සේ ඔබ ගලා ඒ නම්
- අහසයි ඔබ මට

**ක්‍රියාකාරකම 3.1**

පහත ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

1. 'කටු අකුලේ මල් ඇහැරේ' ගීතයේ රචකයාගේ නම කුමක් ද?
2. කතුවරයාගේ වෙනත් ගීත නිර්මාණ දෙකක් නම් කරන්න.

## ගී ගයමු; රස විඳිමු

ගුරුතුමාගේ/ගුරුතුමියගේ උපදෙස් අනුව මේ ගීතය තාලයට ගායනා කරමින් රස විඳින්න.

කටු අකුලේ මල් ඇහැරේ
රළු අහසේ තරු හිනැහේ
රළු අහසේ තරු හිනැහේ
කටු අකුලේ මල් ඇහැරේ

තුඩින් තුඩේ රැව් නැගේ
කුරුලු ගී ගායනා
කුළින් කුළේ වැතිරෙතේ
සුදු වලා පාවෙනා

ළමයින් සුවඳයි
කඳුළක දිලිසෙයි
අඳුරු විමානේ
රන්මිණි පහනයි

කටු අකුලේ මල් ඇහැරේ
රළු අහසේ තරු හිනැහේ
රළු අහසේ තරු හිනැහේ
කටු අකුලේ මල් ඇහැරේ





අනාථ දෑසේ
කෙම්බිම ඔබමයි
මිලාන ලෝකේ
හසරැලි උයනයි

තුඩින් තුඩේ රැව් නැගේ
කුරුලු ගී ගායනා
කුළින් කුළේ වැතිරෙතේ
සුදු වලා පාවෙනා

කටු අකුලේ මල් ඇහැරේ
රළු අහසේ තරු හිනැහේ
රළු අහසේ තරු හිනැහේ
කටු අකුලේ මල් ඇහැරේ

**ගී පද** : බන්දුල නානායක්කාරවසම්
**සංගීතය** : ආනන්ද ගමගේ
**ගායනය** : එඩ්වඩ් ජයකොඩි සහ ළමා පිරිසක්

ඔබේ ගුරුතුමා/ගුරුතුමිය සමග මෙම ගීතය පිළිබඳ කරන සාකච්ඡාවේ දී ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.

## ගීතයේ විශේෂතා හඳුනා ගනිමු

★ ගීතය රසවත් හා සරල භාෂාවකින් ලියා තිබෙනවා.
'කටු අකුලේ මල් ඇහැරේ'

★ ගායනයට පහසු තාලයකට අනුව ලියා තිබෙනවා.
'තුඩින් තුඩේ රැව් නැගේ'
'කුරුලු ගී ගායනා'

★ පරිසරයේ සිදුවීම් හා අජීවී වස්තු ළමා ලෝකය සමග අපූරුවට ගළපා තිබෙනවා.
'කටු අකුලේ මල් ඇහැරේ'

★ පරිසරයේ ඇති පණ නැති දෙයට පණ ලැබී ඇති බවක් ගීතයට සවන් දීමේ දී අපට දැනෙනවා.

'මල් ඇහැරේ'
'තරු හිනැහේ'

★ සොබා දහම සමග ගළපමින් ළමා ලොවේ සුන්දරත්වය හා වටිනාකම පෙන්වා දීමට මෙම ගීතයෙන් උත්සාහ දරා තිබෙනවා.

## ක්‍රියාකාරකම 3.2

ගීතය ඇසුරෙන් අසා ඇති පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. මල් පිපෙනවා යන අදහස කවියා ඉදිරිපත් කර ඇත්තේ කෙසේ ද?
2. තුඩින් තුඩ රැව් නැගෙන්නේ මොනවා ද?
3 'කටු අකුලේ මල් ඇහැරේ' යන යෙදුමේ සැඟවුණු අදහස කුමක් ද?
4. මෙම ගීතයෙන් පුංචි ඔබට ලබා ගත හැකි ආදර්ශ මොනවා ද?

## ක්‍රියාකාරකම 3.3

1. පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් වන්න.
2. මෙම ගීතය රසවත් වීමට හේතු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
3. ඔබ හඳුනා ගත් හේතු පන්තියට ඉදිරිපත් කරන්න.
4. අනෙක් කණ්ඩායම්වලින් ඉදිරිපත් වන අදහස්වලට සවන් දෙන්න.
5. 'කටු අකුලේ' ගීතය රසවත් වීමට හේතු වූ කරුණු දෙකක් ඔබේ සටහන් පොතේ ලියන්න.

**ඔබගේ හැකියාව ඔබ ම අගයන්න.**
**ඔබේ හැකියාවට අදාළ කොටුවේ හරි ලකුණ (✓) යොදන්න.**

| මගේ හැකියාව | ඉතා හොඳයි | හොඳයි | තරමක් හොඳයි |
|---|---|---|---|
| 1. 'කටු අකුලේ මල් ඇහැරේ' ගීතයේ රචකයාගේ නම කියන්න මට පුළුවන් | | | |
| 2. එම රචකයා ලියා ඇති වෙනත් ගීතවල නම් කියන්න මට පුළුවන් | | | |
| 3. ගීතයේ ඇති යෙදුම්වල අදහස සරල බසින් ඉදිරිපත් කරන්න මට පුළුවන් | | | |
| 4. 'කටු අකුලේ මල් ඇහැරේ' ගීතයෙන් මගේ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ කියන්න මට පුළුවන් | | | |
| 5. ගීතය රසවත් වීමට හේතු වූ කරුණු දෙකක් කියන්න මට පුළුවන් | | | |

## වැඩිදුර ඉගෙනුම සඳහා

- අඹ යහළුවෝ ටෙලි නාට්‍යයේ ඇතුළත් වන අනෙක් ගීත නිර්මාණ අන්තර්ජාලයෙන් සොයා රස විඳින්න.
- තවත් රසවත් හා හරවත් ගීත නිර්මාණ සොයා ගෙන රස විඳින්න.

# සාහිත්‍යයෙන් ජීවිතයට අත්වැලක්...



කාලච්ඡේද 01යි.

- ඔබ රස විඳි සාහිත්‍ය නිර්මාණ ඇසුරෙන් අසා ඇති පහත සඳහන් ප්‍රශ්න අවධානයෙන් කියවන්න. පහත ක්‍රියාකාරකම්වල නිරත වීමට සූදානම් වන්න.

1. ‘පුලුන් රොද’ කතන්දරයේ එන මහලු කාන්තාවට උපකාර කරන ලෙස ඔබෙන් ඉල්ලා සිටියොත් ඔබ එය ඉටු කරන ආකාරය විස්තර කරන්න.
2. ‘පුලුන් රොද’ ජනකතාවේ සඳහන් අක්කාගේ දුව ඔබ යැයි සිතා ඇය කටයුතු කරන ආකාරය වෙනස් කිරීමට ඔබට අවස්ථාව ලැබෙන්නේ නම් ඔබ එය කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.
3. ‘ළමයා සහ ගොළුබෙල්ලා’ කවි පන්තියේ ගොළුබෙල්ලාට ගස මුදුනට යන ගමනේ දී හමු විය හැකි බාධා මොනවා දැයි විස්තර කරන්න.
4. ඔබේ ජීවිතයේ ඉවසීමෙන් කටයුතු කළ අවස්ථාවක් කියන්න. එසේ කටයුතු කිරීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන මොනවා ද ?
5. ‘කටු අකුලේ මල් ඇහැරේ’ ගීතයේ පරිසරය අලංකාර කිරීමට කුරුල්ලෝ ගී ගයති. පරිසරය අලංකාර කිරීමට ඔබට කළ හැකි දේවල් පැහැදිලි කරන්න.
6. ‘කටු අකුලේ මල් ඇහැරේ’ ගීතයෙන් කියවෙන ආකාරයට දුෂ්කර පරිසරයක ඇති අභියෝග ජය ගෙන ලෝකයට ආලෝකයක් වීමට ඔබ අධිෂ්ඨාන කර ගෙන සිටින ආකාරය විස්තර කරන්න.

## ක්‍රියාකාරකම 3.4

පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් වන්න.

- ඔබගේ කණ්ඩායමට ලැබෙන ප්‍රශ්නයට/ප්‍රශ්නවලට පිළිතුරු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- ඔබ සාකච්ඡා කළ කරුණු පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කිරීම සඳහා විවිධ මාධ්‍ය යොදා ගන්න.
- අනෙක් කණ්ඩායම් ඉදිරිපත් කරන කරුණුවලට හොඳින් සවන් දී වැදගත් කරුණු මතකයේ රඳවා ගන්න.
- අනෙක් කණ්ඩායම් ඉදිරිපත් කරන ලද නිර්මාණශීලී පිළිතුරු අගය කරමින් අදහස් දක්වන්න.

## ක්‍රියාකාරකම 3.5

- ඉහත 1 සිට 6 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු අභ්‍යාස පොතේ සටහන් කරන්න.
- පිළිතුරු ලිවීමේ දී කණ්ඩායම් ක්‍රියාකාරකමේ දී සාකච්ඡා කළ තොරතුරුවලට අමතර ව ඔබේ අදහස් ද එකතු කරන්න.

## උගත් දේ සිහි කරමු.

මෙම මොඩියුලය හැදෑරීමෙන්,

- ‘පුලුන් රොද’, ‘ළමයා සහ ගොළුබෙල්ලා’ සහ ‘කටු අකුලේ මල් ඇහැරේ’ යන නිර්මාණවල පසුබිම් තොරතුරු හඳුනා ගැනීමටත්
- එක් එක් නිර්මාණය අර්ථාවබෝධ කර ගනිමින් රස විඳීමටත්
- එක් එක් නිර්මාණයේ තේමාව නිවැරදි ව හඳුනා ගෙන ඉදිරිපත් කිරීමටත්
- එක් එක් නිර්මාණය රසවත් වීමට හේතු වූ කරුණු හඳුනා ගෙන ඉදිරිපත් කිරීමටත්
- එක් එක් සාහිත්‍ය නිර්මාණය මගින් ලබා ගත හැකි ආදර්ශ ජීවිතයට එකතු කර ගැනීමටත්

ඔබට හැකියාව ලැබෙන්නට ඇත.

## අර්ථය හඳුනා ගනිමු

| | |
|---|---|
| තළලා | ගහලා/පහර දීලා |
| දිය ටිකක් ඇදලා වක්කරලා | නාවලා |
| වේ රැනක | ‘වේ’ පඳුරුවල තිබෙන හීන් වැලක් වැනි කටු සහිත කොටස |
| වගතුග | තොරතුරු |
| රචකයා | ගද්‍ය පද්‍ය ආදිය රචනා කරන්නා |
| වෙස | ආකාරය/විලාසය |
| අකුල | කුඩා පඳුරු සහිත වන ලැහැබ |
| කුළින් කුළේ | කඳු මුදුනින් කඳු මුදුනට |
| කෙම්බිම | කාන්තාරයේ පිහිටි දිය හා ගස්වැල් පිරි සාරවත් වූ භූමිය |
| හසරැලි | සිනහව |